ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
Department of Pensions

2023

වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්
வருடாந்த செயற்றிறன் அறிக்கை மற்றும் கணக்குகள்
Annual Performance Report & Accounts

කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2023

වැය ශීර්ෂ අංකය - 253

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත

කොළඹ 10

පටුන

1. ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම 1

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු 2

1.3. ප්‍රධාන කාර්යයන්..... 3

1.4. සංවිධාන සටහන 4-5

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ව්‍යාපෘති.....7-20

අභියෝග 20

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ 21

3. 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 23

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....24

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.....25

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්.....26

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.....27

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....27

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....28

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.....28

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් 29-30

3.10. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් (පළාත් සභා සහ මධ්‍යම රජය).....31-38

3.11. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම 39-41

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම් 42-43

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව.....44-67

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....69-72

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු.....73

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....73

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.....75

6.3. මානව සම්පත් සංවර්ධනය.....75-77

7. අනුකූලතා වාර්තාව 79-86

01. ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශ්‍රාමික ප්‍රජාව වෙත සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හිමිගන්වනු ලබන ප්‍රමුඛතම ආයතනය වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වර්ෂ 1970 දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කර ඇති අතර මේ වන විට අඩ සියවසක් ඉක්මවූ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් නීතිය මෙරටට නිදහස ලැබීමට පෙර සිටම, එනම් 1898 ජූනි මස 23 දින සිට බලාත්මක වූ 1898 අංක 01 දරන වැන්දඹු අතත්දරු අරමුදල් ආඥා පනතට අනුව ක්‍රියාත්මක කිරීම ආරම්භ වී ඇත. එතැන් සිට රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීමේ කාර්යභාරය මහ භාණ්ඩාගාරය යටතේ සිදුවී ඇත.

1934 පෙබරවාරි 05 දින නිකුත් කරනු ලදුව 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධනය කොට හා කලින් කල සංශෝධනයන්ට ලක්වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යන අණපනත් මූලික කොට විශ්‍රාමිකයින් සඳහා ප්‍රතිලාභ හිමිගැන්වීම හා ගෙවීම් කරනු ලබයි. එමෙන්ම 1953 අංක 44 දරන වැන්දඹු අනත්දරු අරමුදල් පනත සහ පිරිවෙන්, උපකෘත පාසල් සඳහා වූ විශ්‍රාම වැටුප් රෙගුලාසි, 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය හා 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයන් ද ක්‍රියාත්මක වේ.

ඉහත නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව සිවිල් විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් යන විෂයයන්ට අදාළව සියලු ගෙවීම් හා අයකිරීම් නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

මෙම සියලු ක්‍රමවේදයන් ඔස්සේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ ලබන විශ්‍රාමිකයින්ගේ සහ ඔවුන්ගේ උරුමකරුවන්ගේ ප්‍රතිලාභ තහවුරු කිරීමට මෙන්ම විශ්‍රාම වැටුප් ගෙවීමෙන් ඔබ්බට සමාජ හා ආර්ථික වශයෙන් තෘප්තිමත් විශ්‍රාමිකයකු බිහි කිරීම වෙනුවෙන් පෙරගමන්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබන අතර මේ වන විට 700,000 කට අධික රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ සහ පසු ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු ඉහළ නිරවද්‍යතාවයකින් හා විනිවිදභාවයකින් යුතුව සිදු කරනු ලබයි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුකූලව 2023 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කළමනාකරණය හා හිමිගැන්වීමේ ක්‍රියාවලිය හා මූල්‍ය ක්‍රියාකාරකම් හි සාධනීය තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions



දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්



මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා වක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමිගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටිය දී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන් ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබඳ ලෝක ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදු කරනු ලැබේ.

1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

I. **රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ "ට" උප ලේඛනය ට ඇතුලත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම.

II. **සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම, වන්දි වැටුප් හා දීමනා, දුබලතා විශ්‍රාම වැටුප්, ස්ථාවර මාසික දීමනා හා යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

III. **වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සිවිල් අධිකරණ හා හමුදා සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සඳහා මරණ පාරිතෝෂික හිමිගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

IV. **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමිගැන්වීම**

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

1.3.2 ගෙවීම් නියාමනය

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.


1.3.3 ලැබීම් නියාමනය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංරක්ෂණයන්ට අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගුරු වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට නැතහොත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ මණ්ඩලය (රා.සේ.අ.අ.)
ලේකම් හා ගණකාධිකාරී (රා.සේ.අ.අ)
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී I
ගණකාධිකාරී (දෙපාර්තමේන්තු ගෙවීම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
ගණකාධිකාරී (දායක මුදල්)
ගණකාධිකාරී (මාසික ගෙවීම්)
ගණකාධිකාරී (පාරිතෝෂික)
ගණකාධිකාරී (වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම)
ගණකාධිකාරී (විෂමතා)
වෛද්‍ය උපදේශක
අධ්‍යක්ෂ (ඩිජිටල් පරිපාලන හා සේවා)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) SLAS
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) SLITS
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)
නීති නිලධාරී
අධ්‍යක්ෂ (වැ.අ.ව්.වැ.)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.අ.ව්.වැ.I)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.අ.ව්.වැ. II)
අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සන්නද්ධ සේවා)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්)
අධ්‍යක්ෂ (පාලන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ප්‍ර.ක.සේ.නි (මා.ස.)
ප්‍ර.ක.සේ.නි (පාලන)
ශාඛා ප්‍රධානී (තැපැල්)
ශාඛා ප්‍රධානී (පාලන)
ශාඛා ප්‍රධානී
සහයක කාර්ය මණ්ඩලය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2023.12.31

තනතුරේ ස්වභාවය	තනතුර	අදාළ වන සේවය	වැටුප් ක්‍රමය	අනුමත මුළු තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම)	Primary Grade	SL-2-2016	1	0	1
	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ	SLAS (Class I)	SL-1-2016	5	5	0
	ප්‍රධාන ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	1	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SLAcS(Class I)	SL-1-2016	1	0	1*
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLAS(Class II or III)	SL-1-2016	10	10	0
	ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	1	0
	ගණකාධිකාරී	SLAcS(Class II or III)	SL-1-2016	9	7	2
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLITS(Class II or III)	SL-1-2016	1	1	0
	නීති නිලධාරී	Dept	SL-1-2016	1	1	0
	පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම)	Dept		3	0	3
				35	**28**	**07**
කෘතිය මට්ටම	පරිපාලන නිලධාරී	PMAS (Supra)	MN-7-2016	4	3	1
	භාෂා පරිවර්තක සිංහල -ඉංග්‍රීසි - 01 සිංහල - දෙමළ - 01	TS	MN-6-2016	2	2	0**
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	SLICTS	MN-6-2016	5	3	2
				11	**8**	**3**
ද්විතීය මට්ටම	කාර්මික නිලධාරී	SLTS	MN-3-2016	1	0	1
	අයවැය සහකාර	RS	MN-4-2016	1	0	1
	විශ්‍රාම වැටුප් නිලධාරී	Dept.	MN-4-2016	186	185	1***
	සංවර්ධන නිලධාරී	DOS	MN-4-2016	598	584	14
	කළමනාකරණ සේවා නිලධාරී	MSO	MN-2-2016	190	165	25
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	SLICTS	MT-1-2016	5	4	1
	ලේඛණ සහකාර	Dept.	MN-1-2016	119	118	1***
	Help Desk Operator	Dept.		2	0	2
				1,102	**1,056**	**46**
ප්‍රාථමික මට්ටම	බංගලා භාරකරු	Dept.	PL-1-2016	2	1	1
	අරක්කැමි / උද්‍යාන කම්කරු	Dept.	PL-2-2016	4	3	1
	රියදුරු	DS	PL-3-2016	12	10	2
	විදුලි කාර්මික	Dept.	PL-3-2016	1	0	1
	කාර්යාල කාර්ය සහායක	OES	PL-1-2016	78	66	12
				97	**80**	**17**
එකතුව				**1,245**	**1,172**	**73**

* ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු අනුයුක්ත කර ඇත.
** භාෂා පරිවර්තක සේවයේ නියුතු සේවක සංඛ්‍යාව - ඉංග්‍රීසි - දෙමළ - 01, සිංහල - ඉංග්‍රීසි - නැත
*** විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් නැවත බඳවා ගැනීම සිදු නොකරයි.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. පාලන අංශය
2. විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
3. මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
4. සත්කාර පියස
5. ප්‍රතිපත්ති හා විමර්ශන අංශය
6. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය
7. විදේශ විශ්‍රාම වැටුප් අංශය
8. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය
9. ගිණුම් අංශය
10. මාසික ගෙවීම් අංශය
11. පාරිතෝෂික ගෙවීම් අංශය
12. විෂමතා අංශය
13. වැන්දඹු අනත්දරු දායක මුදල් කළමනාකරණ අංශය
14. සැපයුම් අංශය
15. වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය
16. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
17. නීති අංශය
18. අභ්‍යන්තර විගණන අංශය
19. තොරතුරු තාක්ෂණ අංශය
20. මාධ්‍ය අංශය
21. තැපැල් අංශය
22. 1970 - ක්ෂණික දුරකථන ඇමතුම් අංශය

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ව්‍යාපෘති

- **රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම හේතුවෙන් ඉහළ ගිය විශ්‍රාමිකයින් සංඛ්‍යාව සඳහා විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ නිශ්චය කර ඇති නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස හැරුණු කොට අනෙක් සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වසය 2022.01.01 දින සිට බලාත්මක වන පරිදි අවුරුදු 65 දක්වා ඉහළ දමන ලදී. කෙසේ නමුත්, නැවත අංක 22/1403/605/014 හා 2022.09.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා පහළ දමන ලද අතර එය 2023.01.01 දින සිට ක්‍රියාත්මක විය. ඒ අනුව 2023 වර්ෂය තුලදී නව විශ්‍රාමිකයින් 39,539 ක් සඳහා ගෙවීම් සිදුකර 2024 ගෙවීම් සඳහා අයඳුම්පත් 1102ක් අනුමත කරනු ලැබිණි.

- **විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම සඳහා දත්ත පද්ධති වැඩිදියුණු කිරීම**

- 2023.12.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 05/2023 මගින් 2024.01.01 දින සිට ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනයන්ට අදාල අයඳුම්පත් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ යොමු කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
- 2023.12.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015(සංශෝධන V) අනුව 2016.01.01 දිනෙන් පසු රාජ්‍ය සේවයෙන් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමිගැන්වීම සඳහා කටයුතු කර ඇත.
- 2023.12.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2009 (සංශෝධන II) මගින් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් තීරණයන්ට අදාල වෛද්‍ය මණ්ඩල වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් සෘජුවම ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත.
- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 අනුව කටයුතු සිදු කිරීමේදී දත්ත පද්ධතියේ සිදු කළ යුතු නව්‍යකරණයන් කවරේද යන්න හඳුනාගැනීම හා එතුළින් මතුවන ගැටළු සඳහා විසඳුම් වශයෙන් නව දත්ත පද්ධතියක් හඳුන්වාදීම.
- හිඟ වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවීමේදී අයකරනු ලබන පොලී ප්‍රතිශතය හා පොලී ක්‍රමය පිළිබඳ නිවැරදි මඟ පෙන්වීමක් සහිතව 03/2008 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය සංශෝධනය කරමින් 03/2008(I) සංශෝධිත චක්‍රලේඛය නිකුත් කිරීම.

- **නාවික සේවයේ නියුතු විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතිකය ලබා ගැනීම.**

2023.02.27 දිනැති 02/2023 විශ්‍රාම වැටුප් උපදෙස් ලිපිය අනුව මුහුදු ආරක්ෂක සේවයේ හෝ නාවික යාත්‍රාවල සේවය කරනු ලබන රජයේ විශ්‍රාමිකයින් සඳහා මෙරටින් පිටවීමට ප්‍රථම සිය ජීවිත සහතිකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදිය හැකි අතර එසේ නොමැති නම් ගොඩ බසින රටක පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලය හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලය හරහා හෝ සහතික කර ලබා ගත් ජීවිත සහතික ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් කිරීමට ඉඩකඩ සලසා දී ඇත.

- **විශ්‍රාමික හැඳුනුම්පත නව්‍යතාවයකින් යුක්තව නිකුත් කිරීමට පියවර ගැනීම.**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධාරීන් හඳුනාගැනීම සඳහා නිකුත් කරනු ලබන විශ්‍රාමික හැඳුනුම්පත නව්‍යතාවයකින් යුතුව නිකුත් කිරීමට පියවර ගෙන ඇත. එය විශ්‍රාම වැටුප සක්‍රීය කරන අවස්ථාවේදීම ලබා දීම 2023.04.10 වැනි දින සිට ආරම්භ කෙරිණි.

විශ්‍රාමිකයන්ගේ පළමු විශ්‍රාම වැටුප සක්‍රීය කරනු ලබන සත්කාර පියස සම්මුඛ පරීක්ෂණයේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ ඇති මාර්ගගතව (Online) ඇතුළත් කරනු ලැබූ තොරතුරු සමඟ ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් හා ඇඟිලි සලකුණු ලබා දීමෙන් අනතුරුව නව විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කරනු ලබයි.





විශ්‍රාමික හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමාරම්භක උළෙලේ අවස්ථාවක්

- මෙතෙක් විමධ්‍යගත ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීම සිදු කරන ලද නිලධාරීන් හට පමණක් සීමා වී තිබූ විශ්‍රාමික සම්මුඛ පරීක්ෂණ කටයුතු සහ විශ්‍රාමික හැඳුනුම්පත් ලබාදීම මධ්‍යගත ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීම සිදු කරන ලද නිලධාරීන් සඳහා ද ආරම්භ කරන ලදී.

- **වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය**

2023 වර්ෂය තුල වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික ක්‍රමයේ ලියාපදිංචි වීම සඳහා ලැබී ඇති අයදුම්පත් වලින් 62,539 ක් සඳහා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික අංක නිකුත් කර ඇත.

- **පාරිතෝෂික ගෙවීම් කිරීම**

2023 වර්ෂය තුලදී විශ්‍රාමිකයින් 55,091ක් සඳහා විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවා ඇති අතර ඒ සඳහා රු.බිලියන 64ක් වැයවී ඇත.

- **අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදු කිරීම**

විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ පවතින ගැටළු සහ විශ්‍රාම වැටුප් වංචා හා අක්‍රමිකතා අවම කර ගැනීම සඳහා 2023 වසර තුළ විගණන පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව භාරිස්පත්තුව සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂා කිරීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 24ක විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධති පරීක්ෂාව සහ ලක්ෂ 12.5 ට වැඩි ලිපිගොනු පරීක්ෂාව, විශේෂ පරීක්ෂණ 7ක් සහ දෙපාර්තමේන්තු විගණන පරීක්ෂණ 3ක් පවත්වා ඇති අතර සේවා අවශ්‍යතාවය මත විවිධ කරුණු සම්බන්ධයෙන් විගණන ක්‍රියාකාරකම් 268 ක් සිදු කර ඇත.

- **ජාතික විශ්‍රාමික දිනය සැමරීම**

ශ්‍රී ලාංකීය විශ්‍රාමික ප්‍රජාව රාජ්‍ය සේවය වෙනුවෙන් සිදුකලා වූ සේවය වෙනුවෙන් සෑම වසරකම ඔක්තෝබර් 08 දින ජාතික විශ්‍රාමික දිනය උත්සවාකාරයෙන් සැමරීම සිදු කරනු ලබන අතර මෙවර ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව ගරු අග්‍රාමාත්‍ය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශ්‍රාමිකයින් සඳහා වෛද්‍ය සායනයක් කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතන පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

  - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ යටතේ මාර්ගගත පුහුණු වැඩසටහන් 14ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරීන් 5,127 දෙනෙකු සහභාගී වී ඇත.
  - දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ආයතනික කටයුතු සහ ගොනු කළමනාකරණය, Excel, ලිපිගොනු කළමනාකරණ පද්ධතියේ නව සංස්කරණය හඳුන්වාදීම සහ රියදුරු මහතුන් සහ කාර්යාල සේවක මහතුන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් ආදී පුහුණු වැඩසටහන් 05 ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරීන් 181 දෙනෙකු සම්බන්ධ වී ඇත. එමෙන්ම විෂයය අවශ්‍යතාව අනුව වෙනත් රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 20 ක් සඳහා නිලධාරීන් හට සම්බන්ධවීමට අවස්ථාව සලසා දී ඇත.
  - දෙපාර්තමේන්තු නිලධාරීන් සම්පත්දායකයින් ලෙස යොදවමින් විවිධ රාජ්‍ය ආයතනයන්හි විශ්‍රාම වැටුප් සම්බන්ධ පුහුණු වැඩසටහන් 22ක් 2023 වර්ෂය තුල පැවැත්වීමට කටයුතු කර ඇත.

- 2023.06.02 සහ 2023.12.14 යන දිනයන්හි දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා පැමිණි ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා ත්‍රිවිධ හමුදාවන්ට අයත් නිලධරයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර සංශෝධිත විශ්‍රාම වැටුප් ගණනය කිරීම පිළිබඳ පොලිස් නිලධාරීන් හට පුහුණු වැඩමුළුවක් පවත්වා ඇත.





නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනේ අවස්ථා

2023 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ

	නිකුත් කළ දිනය	චක්‍රලේඛ අංකය	කාරණය
01	2023.01.05	01/2023	විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසි රැකවරණය සඳහා "බුහුමන්" රක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම
02	2023.02.23	01/2019 (සංශෝධන VI)	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම
03	2023.03.27	02/2023	විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම
04	2023.06.01	03/2008 (සංශෝධන I)	වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකිරීම
05	2023.06.06	02/2023 (සංශෝධන I)	විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම
06	2023.06.09	06/2022 (සංශෝධන I)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව විදේශ රැකියා සඳහා විදේශගත වන නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමට උපදෙස්
07	2023.11.07	03/2023	2024 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම
08	2023.11.17	04/2023	විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසි රැකවරණය සඳහා "බුහුමන්" රක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම
09	2023.12.01	01/2009 (සංශෝධන II)	ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම
10	2023.12.01	09/2015 (සංශෝධන V)	2016.01.01 දිනෙන් පසු රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා සේවයේ යෙදී සිටිය දී මියගිය නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීම
11	2023.12.27	05/2023	ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් සංශෝධන මාර්ගගත පද්ධතිය හරහා සිදු කිරීම
12	2023.12.28	03/2021 (සංශෝධන I)	යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙනනන් වෙත සහන හිමිගැන්වීම
13	2023.12.29	06/2023	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට අදාළ සංශෝධන අනුව දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධාරීන්ගේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට අදාළ ප්‍රේෂණ කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම

2023 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

	නිකුත් කළ දිනය	උපදෙස් ලිපි අංකය	කාරණය
01	2023.01.03	01/2023	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) හා 14/2022(II) අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විදේශ හා දේශීය වැටුප් රහිත නිවාඩු ඉල්ලීම් යොමු කිරීම
02	2023.02.23	07/2022 (සංශෝධන II)	විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතික - 2023
03	2023.02.27	02/2023	නාවික යාත්‍රා හා මුහුදු ආරක්ෂක සේවයේ නියුතු රජයේ විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් හා දීමනා ගෙවීම
04	2023.04.11	03/2023	මහජන දිනය ක්‍රියාත්මක වන සඳුදා දින කාර්යාලයේ රැඳී සිටීම සම්බන්ධයෙනි
05	2023.04.18	04/2023	ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ තොරතුරු MISCO පද්ධතිය මඟින් යාවත්කාලීන කිරීම
06	2023.05.04	05/2023	දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ දුක්ගැනිවිලි සහ එම නිලධාරීන් හට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙතින් සේවාවන් ඉටුකර ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ
07	2023.05.17	06/2023	නව විශ්‍රාමික හැඳුනුම්පත මුද්‍රණය කිරීම
08	2023.06.01	07/2022 (සංශෝධන III)	විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023
09	2023.09.27	01/2023 (සංශෝධන I)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා එහි සංශෝධන අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විදේශ හා දේශීය වැටුප් රහිත නිවාඩු ඉල්ලීම් යොමු කිරීම
10	2023.10.16	02/2020 (සංශෝධන I)	විශ්‍රාමිකයින්ගේ තොරතුරු පිටතට ලබා නොදීම
11	2023.11.30	07/2023	විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතික - 2024

- **විශ්‍රාම වැටුප් ගෙවීම්**
  - **මාසිකව ගෙවීම් කරන ලද සිවිල්, හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව**

මාසය	සිවිල්		හමුදා		වැන්දඹු හා අනත්දරු		එකතුව	
	විශ්‍රාමිකයන් ගණන	මුදල (රු.මිලියන)	විශ්‍රාමිකයන් ගණන	මුදල (රු.මිලියන)	විශ්‍රාමිකයන් ගණන	මුදල (රු.මිලියන)	විශ්‍රාමිකයන් ගණන	මුළු මුදල (රු.මිලියන)
ජනවාරි	367,041	13,573	124,592	5,476	184,989	5,030	676,622	24,079
පෙබරවාරි	367,094	13,739	124,792	5,529	185,401	5,182	677,287	24,450
මාර්තු	368,231	14,032	125,443	5,609	185,731	5,215	679,405	24,856
අප්‍රේල්	371,507	14,605	126,572	5,775	186,201	5,251	684,280	25,631
මැයි	371,468	14,069	126,771	5,603	186,037	5,161	684,276	24,833
ජූනි	373,285	14,783	127,310	5,770	186,227	5,228	686,822	25,781
ජූලි	373,081	14,670	127,074	5,748	184,734	5,226	684,889	25,644
අගෝස්තු	375,174	14,890	127,738	5,817	185,538	5,278	688,450	25,985
සැප්තැම්බර්	377,518	15,035	128,553	5,874	186,321	5,258	692,392	26,167
ඔක්තෝබර්	379,639	15,158	129,330	5,926	186,757	5,278	695,726	26,362
නොවැම්බර්	382,251	15,531	130,574	6,139	187,153	5,328	699,978	26,998
දෙසැම්බර්	385,205	15,513	131,739	6,199	187,851	5,376	704,795	27,088
එකතුව		**175,598**		**69,465**		**62,811**		**307,874**

- වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම

වර්ෂය	වියදම (රු,000)
2018	194,494,730
2019	238,689,183
2020	257,833,481
2021	269,827,125
2022	309,066,783
2023	372,364,441

- සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

මාසය	සිවිල්		වැ.අ.වි.වැ.		හමුදා		එකතුව	
	විශ්‍රාමිකයන් ගණන	ගෙවන ලද මුදල (රු)	විශ්‍රාමිකයන් ගණන	ගෙවන ලද මුදල (රු)	විශ්‍රාමිකයන් ගණන	ගෙවන ලද මුදල (රු)	විශ්‍රාමිකයන් ගණන	මුදල (රු)
ජනවාරි	1172	202,841,321	391	112,207,069	458	72,439,380	2,021	387,487,770
පෙබරවාරි	1469	346,633,219	1249	273,560,799	573	119,567,882	3,291	739,761,899
මාර්තු	2138	556,145,157	1074	278,138,019	639	138,505,395	3,851	972,788,571
අප්‍රේල්	3847	1,029,673,406	1100	263,035,736	1076	251,467,275	6,023	1,544,176,417
මැයි	1100	335,784,371	724	179,888,386	332	76,555,834	2,156	592,228,591
ජුනි	2955	1,009,517,055	985	246,939,620	674	188,465,465	4,614	1,444,922,140
ජුලි	2480	848,413,916	934	268,814,215	605	173,594,974	4,019	1,290,823,104
අගෝස්තු	2717	935,486,185	1066	257,242,716	682	185,675,481	4,465	1,378,404,382
සැප්තැම්බර්	2738	940,919,429	968	233,574,735	583	146,072,658	4,289	1,320,566,822
ඔක්තෝබර්	2796	952,385,480	906	240,741,853	717	188,339,326	4,419	1,381,466,658
නොවැම්බර්	3505	1,184,316,974	1053	253,705,909	1253	338,047,777	5,811	1,776,070,660
දෙසැම්බර්	3807	1,034,635,370	1260	315,442,554	1223	311,755,639	6,290	1,661,833,563
එකතුව	**30,724**	**9,376,751,883**	**11,710**	**2,923,291,610**	**8,815**	**2,190,487,085**	**51,249**	**14,490,530,578**

- 2023 දෙසැම්බර් දක්වා සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (සිවිල් හා හමුදා)

වර්ෂය	මාසය	2022.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ගැන්වීමේ දිනය යෙදුනු නිලධාරීන් සංඛ්‍යාව		2023.01.01 දින සිට විශ්‍රාම ගැන්වීමේ දිනය යෙදුනු නිලධාරීන් සංඛ්‍යාව		එකතුව
		සිවිල්	හමුදා	සිවිල්	හමුදා	
2023	ජනවාරි	1,172	458	0	0	**1,630**
	පෙබරවාරි	1,341	315	128	258	**2,042**
	මාර්තු	1,900	236	238	403	**2,777**
	අප්‍රේල්	3,094	366	753	710	**4,923**
	මැයි	750	86	350	246	**1,432**
	ජුනි	2,004	181	951	493	**3,629**
	ජුලි	1,380	125	1,100	480	**3,085**
	අගෝස්තු	1,250	87	1,467	595	**3,399**
	සැප්තැම්බර්	803	65	1,935	518	**3,321**
	ඔක්තෝබර්	695	38	2,101	679	**3,513**
	නොවැම්බර්	755	81	2750	1172	**4,758**
	දෙසැම්බර්	672	113	3135	1110	**5,030**
එකතුව		**15,816**	**2,151**	**14,908**	**6,664**	**39,539**

- දිස්ත්‍රික් පදනමින් විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ වියදම - 2023 දෙසැම්බර්

දිස්ත්‍රික්කය	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු)	අඩු කිරීම්	මුදල (රු)
ගම්පහ	90130	3,373,847,970.96	36,069,173.94	3,337,778,797.02
කොළඹ	89700	3,516,348,641.51	30,950,003.67	3,485,398,637.84
කුරුණෑගල	68669	2,721,115,523.57	23,668,557.91	2,697,446,965.66
මහනුවර	61603	2,398,063,957.40	25,473,657.64	2,372,590,299.76
කළුතර	45830	1,724,970,297.59	18,550,287.79	1,706,420,009.80
අනුරාධපුරය	39938	1,560,243,924.97	27,331,136.13	1,532,912,788.84
ගාල්ල	39794	1,528,042,856.77	18,460,668.14	1,509,582,188.63
කෑගල්ල	34149	1,321,641,591.78	15,415,946.36	1,306,225,645.42
බදුල්ල	28926	1,110,221,342.22	17,695,761.74	1,092,525,580.48
මාතර	28897	1,112,674,233.26	10,253,964.76	1,102,420,268.50
රත්නපුර	24238	927,539,865.37	10,155,331.89	917,384,533.48
මාතලේ	18942	730,430,560.76	7,722,245.29	722,708,315.47
හම්බන්තොට	17740	695,370,267.28	11,721,300.53	683,648,966.75
පුත්තලම	16098	603,410,108.26	6,936,228.30	596,473,879.96
යාපනය	15385	570,554,986.21	2,587,562.01	567,967,424.20
අම්පාර	14535	575,814,203.66	7,765,693.96	568,048,509.70
මොණරාගල	12645	465,668,978.94	6,829,599.26	458,839,379.68
පොළොන්නරුව	12395	452,915,980.20	4,927,123.09	447,988,857.11
නුවරඑළිය	11905	442,242,662.42	3,889,388.93	438,353,273.49
මඩකලපුව	9087	354,223,236.18	3,088,012.83	351,135,223.35
ත්‍රිකුණාමලය	8862	347,539,247.26	2,856,246.72	344,683,000.54
විදේශගත	7924	269,643,139.25	4,907,662.46	264,735,476.79
වව්නියාව	3112	124,021,885.61	883,324.44	123,138,561.17
මන්නාරම	1747	68,559,986.89	2,428,368.68	66,131,618.21
කිලිනොච්චි	1298	44,133,573.50	252,481.02	43,881,092.48
මුලතිව්	1246	49,200,893.08	359,648.05	48,841,245.03
එකතුව	**704,795**	**27,088,439,914.90**	**301,179,375.54**	**26,787,260,539.36**

- පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

මාසය	විශ්‍රාමිකයින් සංඛ්‍යාව	මුදල (රු)
ජනවාරි	792	823,797,016
පෙබරවාරි	2,805	2,929,627,986
මාර්තු	1,384	1,213,063,038
අප්‍රේල්	1,857	2,021,760,844
මැයි	8,717	9,433,890,321
ජූනි	2,911	3,821,687,012
ජූලි	2,014	2,068,580,979
අගෝස්තු	6,116	8,074,466,601
සැප්තැම්බර්	5,542	6,245,224,768
ඔක්තෝබර්	3,858	4,238,610,859
නොවැම්බර්	6,379	7,700,173,045
දෙසැම්බර්	12,716	15,886,263,127
එකතුව	**55,091**	**64,467,145,597**

- අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි- දෙසැම්බර්)

මාසය	මුළු විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු)
ජනවාරි	112,897	23,194,600
පෙබරවාරි	113,954	23,953,400
මාර්තු	115,946	25,151,800
අප්‍රේල්	119,901	27,217,600
මැයි	120,801	25,167,200
ජුනි	123,621	28,213,000
ජුලි	125,580	27,838,200
අගෝස්තු	128,221	28,853,200
සැප්තැම්බර්	130,995	29,241,200
ඔක්තෝබර්	133,707	29,936,000
නොවැම්බර්	137,056	31,274,400
දෙසැම්බර්	140,684	32,372,400
එකතුව		**332,413,000**

- රු.5000ක මාසික දීමනාව ගෙවන ලද විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

මාසය	විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු)
ජනවාරි	579,416	2,893,008,542
පෙබරවාරි	579,216	2,891,993,363
මාර්තු	580,917	2,900,434,792
අප්‍රේල්	585,030	2,920,968,792
මැයි	585,168	2,921,618,031
ජුනි	587,331	2,932,425,833
ජුලි	587,263	2,932,156,720
අගෝස්තු	590,310	2,947,382,688
සැප්තැම්බර්	593,543	2,963,532,083
ඔක්තෝබර්	596,242	2,977,032,916
නොවැම්බර්	600,028	2,995,942,500
දෙසැම්බර්	604,076	3,016,174,654
එකතුව		**35,292,670,913**

- විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- දෙසැම්බර්)

මාසය	සංඛ්‍යාව	ගෙවූ මුදල (රු)
ජනවාරි	767	86,327,301
පෙබරවාරි	882	103,236,835
මාර්තු	708	87,984,158
අප්‍රේල්	771	94,930,182
මැයි	585	69,997,100
ජුනි	974	120,134,087
ජුලි	885	117,721,971
අගෝස්තු	971	137,094,363
සැප්තැම්බර්	950	145,240,473
ඔක්තෝබර්	853	127,677,983
නොවැම්බර්	1,149	176,302,457
දෙසැම්බර්	962	144,365,904
එකතුව	**10,457**	**1,411,012,815**

- **වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)**

මාසය	ගෙවූ සංඛ්‍යාව
ජනවාරි	173
පෙබරවාරි	104
මාර්තු	175
අප්‍රේල්	115
මැයි	216
ජූනි	282
ජූලි	325
අගෝස්තු	262
සැප්තැම්බර්	398
ඔක්තෝබර්	248
නොවැම්බර්	271
දෙසැම්බර්	565
එකතුව	**3,134**

- **සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2023 දෙසැම්බර් දක්වා**

ආයතනය	සංඛ්‍යාව	2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා
		ගෙවූ මුදල රු.මිලියන
යුද්ධ හමුදා	34,377	35,903
නාවික හමුදා	1,486	1,504
ගුවන් හමුදා	487	448
පොලිස්	1,692	1,971
ස්ථාවර දීමනා ගෙවීම්	2,825	1,191
රු.5000 දීමනා ගෙවීම්	36,696	2,081
එකතුව	**40,867**	**43,098**

- **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම්**

මාසය	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම්	මරණ පාරිතෝෂික ගෙවීම්
ජනවාරි	360	75
පෙබරවාරි	1159	186
මාර්තු	970	139
අප්‍රේල්	865	127
මැයි	631	95
ජූනි	864	58
ජූලි	820	47
අගෝස්තු	951	56
සැප්තැම්බර්	885	98
ඔක්තෝබර්	805	156
නොවැම්බර්	914	165
දෙසැම්බර්	1155	99
එකතුව	**10,379**	**1,301**

- **සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් සහ සංශෝධන**

විශ්‍රාම වැටුප් වර්ගය	ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ ගුවන්/ නාවික)
සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (අවු.10/12 ට අඩු)	324
හමුදා සංශෝධන	2,750
දුබලතා සේවා විශ්‍රාම වැටුප් ගෙවීම්	13
ප්‍රතිශෝධන (අවුරුදු 55 සම්පූර්ණ)	1,139
මරණ පාරිතෝෂික	239
සේවා පාරිතෝෂික	2,169
යැපෙන්නන්ගේ දීමනා	548
දුබලතා විශ්‍රාම වැටුප	03
ස්ථාවර දීමනා	1,426
විශේෂ වන්දි	106
නැවත සේවා	107
එකතුව	**8,822**

- **විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව**

මාසය	විශ්‍රාමිකයින් ගණන	ගෙවූ මුදල (රු)
ජනවාරි	6904	236,388,881
පෙබරවාරි	7108	243,172,272
මාර්තු	7345	264,412,764
අප්‍රේල්	7611	288,620,743
මැයි	7820	274,589,109
ජුනි	7997	283,512,746
ජුලි	7043	235,731,300
අගෝස්තු	7285	260,723,341
සැප්තැම්බර්	7473	259,454,321
ඔක්තෝබර්	7641	259,126,413
නොවැම්බර්	7788	271,407,656
දෙසැම්බර්	7924	269,643,139
එකතුව		**3,146,782,684.77**

- **වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම්**

වර්ෂය	වටිනාකම (රු' 000)
2018	30,909,246
2019	34,262,885
2020	38,107,393
2021	38,591,300
2022	41,003,000
2023	43,968,727

- **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)**

මාසය	ලැබීම් (රු)	ගෙවීම් (රු)
ජනවාරි	82,101,138	48,735,878
පෙබරවාරි	45,596,936	62,541,961
මාර්තු	68,444,192	75,692,173
අප්‍රේල්	54,581,886	69,444,047
මැයි	59,353,411	93,582,571
ජුනි	62,410,924	71,639,024
ජුලි	76,718,174	31,923,305
අගෝස්තු	70,683,511	54,086,436
සැප්තැම්බර්	67,533,544	53,764,053
ඔක්තෝබර්	64,178,089	56,497,738
නොවැම්බර්	69,797,098	49,581,654
දෙසැම්බර්	70,873,575	53,026,451
එකතුව	**792,272,478**	**720,515,290**

- **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)**

මාසය	අලුතින් එක් වූ සාමාජික සංඛ්‍යාව	ඉවත් වූ සාමාජික සංඛ්‍යාව
ජනවාරි	2053	514
පෙබරවාරි	943	439
මාර්තු	910	545
අප්‍රේල්	660	437
මැයි	1036	513
ජුනි	950	558
ජුලි	968	377
අගෝස්තු	684	433
සැප්තැම්බර්	950	326
ඔක්තෝබර්	361	307
නොවැම්බර්	492	331
දෙසැම්බර්	317	335
එකතුව	**10,324**	**5,115**

- **අයකරන ලද වැන්දඹු/වැන්දඹු පුරුෂ දායක මුදල් ප්‍රමාණය (ජනවාරි - දෙසැම්බර්)**

විස්තරය	එකතු කරන ලද ආදායම (රු මිලියන)
මධ්‍යම රජය	22,713
පළාත් සභා	13,545
ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	445
එකතුව	**36,703**

- රා.ප.ච 14/2022 යටතේ දේශීය සහ විදේශ නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරගනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ප්‍රමාණය

මාසය	මුදල (රු)
ජනවාරි	2,018,779
පෙබරවාරි	2,692,710
මාර්තු	4,089,821
අප්‍රේල්	4,009,494
මැයි	5,789,768
ජුනි	5,741,763
ජුලි	7,005,858
අගෝස්තු	9,661,219
සැප්තැම්බර්	8,522,581
ඔක්තෝබර්	11,870,790
නොවැම්බර්	11,275,132
දෙසැම්බර්	13,096,689
එකතුව	**85,774,604**

- ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර - නීති අංශය

ගොණු හා ලිපි වර්ගය	ප්‍රමාණය	නිරීක්ෂණ ලබා දී ඇති ප්‍රමාණය	උපදේශණ සඳහා සහභාගි වූ ප්‍රමාණය	අවසන් කිරීමට ඇති ප්‍රමාණය
මානව හිමිකම් පැමිණිලි	265	265	-	-
මානව හිමිකම් සිතාසි	52	52	-	-
ඔම්බුඩ්ස්මන් පැමිණිලි	180	180	-	-
වෙනත් ලිපි	70	70	-	-
ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	04	04	04	-
අභියාචනාධිකරණ නඩු	09	09	09	-
පළාත්බද මහාධිකරණ නඩු	01	01	-	-
නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් සඳහා ගොනු	03	-	-	-
ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම්	10	-	-	-
එකතුව	**594**	**594**	**13**	-

- 2023 වර්ෂයේ ඉටුකර ඇති කාර්යන්හි ප්‍රගතිය - ප්‍රතිපත්ති අංශය

අනු අංක	කාර්යය	අවසන් කර ඇති ඉල්ලීම් ප්‍රමාණය/ ඉදිරිපත් කර ඇති වාර්තා ප්‍රමාණය
01	අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත්, සහන, උපාධිධාරී අභ්‍යාසලාභී, පුහුණු, ත්‍රිවිධ හමුදා සේවා කාල විශ්‍රාම වැටුප ගණනයට අදාළ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම	398
02	පාර්ලිමේන්තු කාරක සභා වෙත නිරීක්ෂණ/නිර්දේශ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම	
	i) මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සම්වලට අදාළව නිර්දේශ වාර්තා යොමු කිරීම	26
	ii) පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා ලබා දීමට නිර්දේශිත පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම	09
	iii) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වෙත ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා නිරීක්ෂණ/ නිර්දේශ ඇතුළත් වාර්තා සකස් කර යොමු කිරීම	09
	iv) විවෘත හා වගකිව යුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් යොමු කරන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාළ නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම	12
03	විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් විශ්‍රාමික සංගම් සමඟ සාකච්ඡා පැවැත්වීම	01

- **රජයට ආදායම් උපයාදීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබාදී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු. 35,782,061.12 මුදලක් සහ නිවාඩු නිකේතන මගින් රු.4,789,060.00 මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

- **දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා සුබසාධනය සඳහා ගනු ලැබූ පියවර**

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් හේමාස් පුද්ගලික රෝහල සමඟ සහයෝගීත්වයෙන් සේවා අවශ්‍යතාව ඇති නිලධාරීන් සඳහා වෛද්‍ය සායනයක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- ඒකාකාරී රාජකාරී දිවියෙන් මිදී කලාවට සාහිත්‍යට ලැදි නිලධාරීන් පිරිසක් බිහිකිරීම සහ උසස් කලා රසවින්දනයකින් යුතු සංවේදී නිලධාරීන් පිරිසක් තුලින් වඩා ඵලදායී සේවා පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමින් Friday Forum වැඩසටහන මෙම වර්ෂයේදී ද පැවැත්වීමට කටයුතු කරන ලද අතර ඊට සමගාමීව මාසිකව විවිධ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.
- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ක්‍රීඩා කෞෂල්‍ය නඟා සිටුවීම සහ සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තු ක්‍රීඩා සංගමය මගින් සුහද ක්‍රිකට් තරඟාවලියක් සහ කැරම් තරගාවලියක් පැවැත්වීමට කටයුතු කරන ලදී.





කැරම් හා ක්‍රිකට් තරඟාවලි අවස්ථා

- අතිශය කාර්යබහුල රාජකාරී පරිසරයෙන් මුදවා නිලධාරීන් හට මඳ අස්වැසිල්ලක් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තු සුභ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද සිංහල දෙමළ අලුත් අවුරුදු උළෙල සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවලට මුල්තැන දෙමින් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල අයවලුන් සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.





භෞතික වැඩිදියුණු කිරීම්

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් අපේක්ෂාවෙන් ඔවුන්ගේ රාජකාරී පරිසරය නවීකරණය කරමින් සියළුම නිලධාරීන් හට පහසු පරිසරයක රාජකාරී සිදු කිරීම සඳහා අවස්ථාව සැලසීම සඳහා අවශ්‍ය කාර්යාල පරිශ්‍රය නවීකරණය කිරීම සිදු කරන ලද අතර ඒ අනුව සීමිත ඉඩකඩක් පැවති මධ්‍යගත අංශය පුළුල් වපසරියක් සහිතව පළමු මහලේ ස්ථාපනය කිරීම සිදු කරන ලදී.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය නවීකරණය කරමින් පහසුකම් වැඩි දියුණු කිරීම.

අභියෝග

- මාර්ගගතව ලැබෙන විශ්‍රාම වැටුප් අයඳුම්පත්‍ර විෂයභාර නිලධාරීන් අසම්පූර්ණව ඉදිරිපත් කිරීම හේතුවෙන් 35% ක් පමණ අයදුම්පත් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බැවින් විශ්‍රාම වැටුප් විෂය රාජකාරී සිදු කරන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් විෂය සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වමින් විෂය නිලධාරීන් නිරන්තරයෙන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- 2016.01.01 දිනට ට පසු රාජ්‍ය සේවයේ පත්වීම්ලාභීන් හට අදාළ වන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ මෙතෙක් නිශ්චිත තීරණයක් ගෙන නොමැති බැවින් ඔවුන් සඳහා ප්‍රතිලාභ ගෙවීම් කිරීමේ ගැටළුකාරී තත්ත්වයක් පැවතීම සහ විශ්‍රාම වැටුප් වියදම ක්‍රමයෙන් ඉහළ යාම සහ මූල්‍ය ප්‍රතිපාදනවල පවතින හිඟතාවය හේතුවෙන් ජාතික දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදුන්වාදීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ප්‍රකාරව ස්ථිර පත්වීම් ලබාදුන් නිලධාරීන්ගේ ස්ථිර පත්වීම් දිනය වන විට වයස අවුරුදු 45 ඉක්මවූ නිලධාරීන් හට විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීම පිළිබඳ පැන නැඟී ඇති ගැටළු සඳහා මෙතෙක් නිශ්චිත පිළිතුරු නොලැබීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ

- කාලීන අවශ්‍යතා හා වෙනස්වීම් හඳුනාගෙන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2018 ට අවශ්‍ය වන්නා වූ සංශෝධනයන් සිදුකර විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම.
- විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා හඳුන්වාදීමට නියමිත නව දත්ත පද්ධති වැඩපිළිවෙල වඩා විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය හරහා ක්‍රියාත්මක කිරීම.
- හමුදා විශ්‍රාම වැටුප් සංශෝධන, මරණ පාරිතෝෂික ගෙවීම සහ සේවා පාරිතෝෂික ගෙවීම් සහ උරුමකරු ගෙවීම් පිළිබඳ මාර්ගගත පද්ධති හඳුන්වාදීම.
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචිය, දායකත්ව සහ හිමිකම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ මාර්ගගත පද්ධතිය හඳුන්වාදීම.
- විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය තුළ අභ්‍යන්තර මොඩියුලයන්ගේ සහ ඒකාබද්ධ කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි සාමාජිකත්වය ලබාගත යුතුව ඇති බහුකාර්ය සංවර්ධන සහායක සහ උපාධිධාරී වැඩසටහනට අදාල නිලධාරීන් 2024 දෙවන කාර්තුව අවසන් වනවිට එම ක්‍රමවේදයේ දායකත්වය ලබාදීමේ කටයුතු අවසන් කිරීම.
- වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජිකත්වය ලබා ගැනීමේ දත්ත පද්ධතිය හා සම්බන්ධිත වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රතිලාභ හිමිගැන්වීමේ කටයුතු ඒකාබද්ධව සිදු කිරීම.
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශයෙන් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා සහ අදාල නෛතික ප්‍රතිපාදන, අවශ්‍ය ආකෘති පත්‍ර ආදිය වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා හැකි වන පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම.
- සේවාලාභීන් සහ හවුල්කාර පාර්ශවයන් වෙතින් ලැබෙන නිරන්තර විමසීම් සඳහා පිළිතුරු ස්වයංක්‍රීයව සැපයෙන ආකාරයේ Chat Bot සකස් කිරීම.
- මහජන දිනයේදී හා මහජන විමසිම් කවුළුව වෙත පැමිණෙන සේවාලාභීන් ලියාපදිංචි කිරීම හා ලබාදෙන සේවාවේ/ සේවාව ලබා ගැනීමේ අවස්ථාවේ දී අයදුම්පතේ තත්ත්වය ආදිය කළමනාකරණය කරගත හැකි පරිදි තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ආදායම් ලැබීම සැලකිල්ලට ගෙන වෙදමුල්ල හා රම්බොඩ නිවාඩු නිකේතනයන්හි නව ව්‍යාපාරික සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීම.

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

03. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එෆිඒ-එල්

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	කළ්‍ය 2023	කළ්‍ය 2022	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1		-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		-	එෆිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3		-	
38,000,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	36,258,424,820	37,415,664,245	
38,000,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**36,258,424,820**	**37,415,664,245**	
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		365,816,860,000	302,307,630,000	එෆිඒ-3
	නැන්පතු **(වර්ෂය තුළ බැරකිරීම්)**		65,687,256	9,643,665	එෆිඒ-4
	අත්තිකාරම් ගිණුම්		63,208,428	51,367,788	එෆිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් (8098 + 8186)		89,136,644,228	77,562,836,883	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**455,082,399,912**	**379,931,478,336**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**491,340,824,732**	**417,347,142,581**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ)= (ඇ)-(ඇ)		**491,340,824,732**	**417,347,142,581**	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
783,650,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	714,460,372	659,693,409	
115,480,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	105,699,705	74,735,469	එෆිඒ-2(ii)
417,764,870,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	415,471,260,072	349,319,177,983	
	පොළී ගෙවීම්	8	-		
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		
418,664,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**416,291,420,149**	**350,053,606,861**	
	මූලධන වියදම්				
12,170,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	10,346,529	3,462,553	
5,710,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,628,664	5,216,133	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-		
1,690,000	හැකියා වර්ධනය	14	1,689,229	1,544,314	
36,430,000	වෙනත් මූලධන වියදම්	15	24,083,934	5,953,783	
56,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**41,748,356**	**16,176,783**	
	නැන්පතු ගෙවීම්		34,926,964	4,847,290	එෆිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		53,825,902	49,735,330	එෆිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ගෙවීම් (8098 + 8186)		88,698,414,289	77,181,532,737	
	ප්‍රධාන ලෙජර වියදම් (ඌ)		**88,787,167,155**	**77,236,115,357**	
418,720,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**505,120,335,660**	**427,305,899,001**	
	දෙසැම්බර් 31 ට ශේෂය ඒ= (ඉ-එ)		**(13,779,510,928)**	**(9,958,756,420)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(13,779,510,928)**	**(9,958,756,420)**	එෆිඒ 7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	එෆිඒ-3

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,072,529,173	2,030,033,484
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5	161,964,558	171,347,085
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		2,234,493,731	2,201,380,569
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		91,610,403	131,753,222
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,072,529,173	2,030,033,484
ප්‍රංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	70,354,155	39,593,863
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		2,234,493,731	2,201,380,569

පිටු අංක 01 සිට 27 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට 49 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපනය කරන ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 26/02/2024	දිනය : 26/02/2024	දිනය : 26/02/2024
ප්‍රදීප් යසරත්න ලේකම් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,	ඒ. ජගත් ඩී. ඩයස් අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කොළඹ 10.	ඒ. ඩී. ටී. එන්. අබේසිංහ ප්‍රධාන ගණකාධිකාරි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.

2

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්ෂ 2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ	-	
ආදායම් නොවන ලැබීම්	14,180,495,021	14,573,141,817
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	90,231,950,991	78,676,740,119
අග්‍රිම ලැබීම්	365,816,860,000	302,307,630,000
අත්තිකාරම් අයකර ගැනීම්	62,901,458	48,007,977
තැන්පතු ලැබීම්	65,687,256	9,643,666
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**470,357,894,726**	**395,615,163,579**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	821,976,366	728,881,759
සහනාධාර සහ මාරුකිරීම්	371,429,179,877	307,973,210,939
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	97,989,765,963	86,844,022,307
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-
අත්තිකාරම් ගෙවීම්	52,455,143	48,453,496
තැන්පතු ගෙවීම්	34,926,964	4,847,290
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**470,328,304,313**	**395,599,415,791**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**29,590,413**	**15,747,788**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී ලාභාංශ		
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	29,590,413	15,747,788
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**29,590,413**	**15,747,788**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(29,590,413)**	**(15,747,788)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**0**	**0**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		
විදේශීය ණය ආපසු ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**0**	**0**
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	සමාජ සංරක්ෂණ දායක මුදල්				
2004.1	මධ්‍යම රජය	24,000,000	24,000,000	22,713,034	94.63%
2004.2	පළාත් සභා	14,000,000	14,000,000	13,545,390	96.75%
8186	ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	280,000	280,000	444,597	158.78%
2002.01.01	කුලී ආදායම්	35,830	35,830	30,264	84.46%
	පළාත් පාලන අරමුදල්				
-	පලාත් පාලන සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	-	-	-	-
-	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	-	-	-	-
-	පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල	-	-	77,966	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. , 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	418,664,000	418,664,000	416,291,420	99%
ප්‍රාග්ධන	56,000	56,000	41,748	74.55%

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	නවක නිලධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීම	30	30	30	100%
02	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පාරිතෝෂික ණය වාරිකය හා පොළිය ගෙවීම	9,298,085	9,298,085	9,298,085	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ද්‍රව්‍යයන්	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණයේ අවසන් වාර්තාව සැකසෙමින් පවතී.	581,259	-	-
9152	යන්ත්‍රෝපකරණ		281,065	-	-
9153	ඉඩම්		1,198,405	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්		11,800	-	-

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම්

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

වියදම්	සටහන් අංක	මුදල (රු.) 2022	මුදල (රු.) 2023	ආදායම්	සටහන් අංක	මුදල (රු.) 2022	මුදල (රු.) 2023
විශ්‍රාම වැටුප් දායකත්වය	01	91,670,744.83	77,965,864.78	ආයතන දායක මුදල් ගිණුම	03	64,599,826.40	61,263,986.51
				ඌනතාවය සමුච්චිත අරමුදලට මාරු කිරීම		27,070,918.43	16,701,878.27
		91,670,744.83	77,965,864.78			91,670,744.83	77,965,864.78

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල
2023.12.31 දිනට ශේෂ පත්‍රය

බැරකම්	සටහන් අංක	මුදල (රු.) 2022	මුදල (රු.) 2023	වත්කම්	සටහන් අංක	මුදල (රු.) 2022	මුදල (රු.) 2023
සමුච්චිත අරමුදල	02	1,116,585,966.63	1,088,746,653.11	ලැබිය යුතු දායක මුදල්	03	1,090,156,001.16	1,073,077,382.44
එකතු කළා අතිරික්තය/ඌනතාවය		(27,070,918.43)	(16,701,878.27)				
		1,089,515,048.20	1,072,044,774.84			1,090,156,001.16	1,073,077,382.44
කලින් ලද දායක මුදල්	03	640,952.96	1,032,607.60				
		1,090,156,001.16	1,073,077,382.44			1,090,156,001.16	1,073,077,382.44

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්වලට අනුකූලව ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. ඉහත සඳහන් ගිණුම් ප්‍රකාශන ඊට අනුකූලව බව මෙයින් සහතික කරමි.

21/2/2024

ඒ.ඩී.ටී.එන්.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

A.D.T.N. ABEYSINGHE
Chief Accountant
Department of Pensions
Maligawatta,
Colombo 10.

21/02/2024

ඒ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(වටිනාකම් රුපියල්)

මෙහෙයුම් ක්‍රියාකාරකම්	2022		සටහන් අංක	2023	
දායක මුදල් ලැබීම්	91,670,744.83		01	77,965,864.78	
වෙනත් බැර කිරීම්	-			-	
විශ්‍රාම වැටුප් දායකත්වය	(91,670,744.83)		01	(77,965,864.78)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය					
ආයෝජන ක්‍රියාකාරකම්					
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය					
වර්ෂය තුලදී ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය					
2023-01-01 මුදල් හා මුදල් සමාන දෑ බැංකු ශේෂය		-			-
2023-12-31 මුදල් හා මුදල් සමාන දෑ බැංකු ශේෂය		-			-

ඩී.ජී.එස්.ඒ - ආදායම්-1 / அ.க.ப.ந அரசிறை-1 /DGSA-Revenue-1

2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් හිඟුම

2023 திசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு

Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2023

ආදායම් ගණන්දීමේ නිලධාරී අරසිරෙ කණක්කීට්ටු උද්දියෝත්තර් Revenue Accounting Officer :	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ஓய்வூதியப் பணிப்பாளர் நாயகம் Director General of Pensions	වියදම් ශීර්ෂ අංකය செலவின தலைப்பு இல: Expenditure Head No.	253

ආදායම් සංකේතය அரசிறை குறியீடு Revenue Code	ආදායම් සංකේත විස්තරය அரசிறை குறியீடு விவரணம் Description of Revenue Code	2023 මූලික ආදායම් ඇස්තමේන්තුව මූල අරසිරෙ මදිප්පීටු 2023 Original Revenue Estimate 2023	2023 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව திருத்திய அரசிறை மதிப்பீடு 2023 Revised Revenue Estimate 2023	2023 රඒකරන ලද මුළු ශුද්ධ ආදායම (දළ ආදායම- ආදායම් ආපසු ගෙවීම) සේකරික්කප්පට්ට මොත්ත තේසිය අරසිරෙ (අරසිරෙ මීළෙලිප්පුකළෙ කළිත්තු) මොත්ත අරසිරෙ 2023 Collected Total Net Revenue (Gross Revenue less Revenue Refunds) 2023	2022 රඒකරන ලද මුළු ශු.ආදායම (දළ ආදායම්-ආදායම් ආපසු ගෙවීම්) සේකරික්කප්පට්ට මොත්ත තේසිය අරසිරෙ (අරසිරෙ මීළෙලිප්පුකළෙ කළිත්තු) මොත්ත අරසිරෙ 2022 Collected Total Net Revenue (Gross Revenue less Revenue Refunds) 2022
		රු./ රූපා/Rs.	රු./ රූපා/Rs.	රු./ රූපා/Rs.	රු./ රූපා/Rs.
20.04.01.00	සමාජ සංරක්ෂණ දායක මුදල් මධ්‍යම රජය சமூக பாதுகாப்புப் பங்களிப்பு பணம் மத்திய அரசு Social Security Contributions Central Government	24,000,000,000	24,000,000,000	22,713,034,278	23,872,352,903
	එකතුව/ மொத்தம்/ Total	24,000,000,000	24,000,000,000	22,713,034,278	23,872,352,903

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වාගෙන යනු ලබන හිඟුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාරයේ හිඟුම් පොත් සමඟ සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விரங்களுடன் ஒத்திருக்கின்றன வெனவும் இப்புள்ளி விரங்கள் திறைசேரிக் கணக்குப் புத்தக நாவுகளுடன் ஒத்துப் போகின்றது என்றும் அத்தாட்சிப்படுத்தப்படுகின்றது.

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in Account Books maintained and all these figures have been reconciled with the figures in the Treasury Books.

ඒ. ඩී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

දිනය திகதி Date: 20-02-24

ප්‍රධාන ගණකාධිකාරී/මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
பிரதான கணக்காளரின்/நிதிப்பகுதியின் தலைவருடைய கையொப்பமும் பெயரும்
Signature and Name of Chief Accountant / Head of Finance

ඩී.ඒ.එස්.ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ආදායම් ගණන්දීමේ නිලධාරී නම්,නනතුර සහ අත්සන
வருவாய் கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப்பமும் பெயரும் பதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

ඩී.ජී.එස්.ඒ - ආදායම්-2 / அ.க.பத அரசிறை-2 /DGSA-Revenue-2

2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම්

(සෑම ආදායම් සංකේතයන් සඳහාම වෙනම ගිණුමක් පිළියෙල කළ යුතුය.)

2023 திசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு

(அரசிறை குறியீடு ஒவ்வொன்றிற்குமாக தயாரிக்கப்பட்டுள்ளது)

Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka

for the year ended 31st December 2023 (To be prepared for each Revenue Code)

	ආදායම් ගණනය කිරීමේ නිලධාරි අරසිරෑ කණක්කිටු உத்தியோத்தர் Revenue Accounting Officer :		විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ஓய்வூதியப் பணிப்பாளர் நாயகம் Director General of Pensions		වියදම් ශීර්ෂ අංකය செலவின தலைப்பு இல: Expenditure Head No.		253
1	I මෙම ගිණුමට අදාළ ආදායම් සංකේතය : 20.04.01.00		I இக்கணக்கு தயாரிக்கப்பட்டுள்ள அரசிறை குறியீடு 20.04.01.00		I Revenue Code for which this Account is prepared: 20.04.01.00		
	II ආදායම් සංකේත විස්තරය :සමාජ සංරක්ෂණ දායක මුදල්		II அரசிறை குறியீட்டின் விவரணம் : சமூக பாதுகாப்புப் பங்களிப்புப் பணம்		II Description of the Revenue Code: Social Security Contribution		
							රු./ ரூபா/Rs.
2	පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් යැකිරීම්	වර්ෂය - 1 (2022)	முந்திய மூனறு நிதியாண்டிற்கான நேரிய அரசிறை சேகரிப்பு	ஆண்டு-1 (2022)	Net Revenue Collection for the three preceeding financial years :	Year - 1 (2022)	23,872,352,903
		වර්ෂය - 2 (2021)		ஆண்டு-2 (2021)		Year - 2 (2021)	22,574,815,425
	(වර්ෂ 2020 සහ ඊට පෙර වර්ෂ)	වර්ෂය - 3 (2020)	(2020 ஆண்டு மற்றும் முன்னய வருடங்களும்)	ஆண்டு-3 (2020)	(year 2020 and previous years)	Year - 3 (2020)	21,394,267,775
	වාර්තා කරනු ලබන වර්ෂය සඳහා ගිණුම් විස්තර		**அறிக்கையிடும் ஆண்டிற்கான கணக்கீட்டத்தகவல்**		**Accounting Information for the Reporting year**	**රු./ ரூபா/Rs.**	**රු./ ரூபா/Rs.**
3	මූලික ආදායම් ඇස්තමේන්තුව		මූල අරසිරෑ මතිප්පීටු		Original Revenue Estimate		24,000,000,000
4	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව		திருத்திய அரசிறை மதிப்பீடு		Revised Revenue Estimate		24,000,000,000
5	දළ ආදායම් යැකිරීම්		மொத்த அரசிறை மதிப்பீடு		Gross Revenue Collection		22,716,778,374
6	සිදු කරන ලද ආපසු ගෙවීම් (මුළු ප්‍රමාණය) - (i)+(ii)		செய்யப்பட்ட மீளளிப்புகள் (மொத்தம்)-(i)+(ii)		Refunds made (All) - (i)+(ii)		3,744,096
	(i) මුදලින් ආපසු ගෙවීම්		(i) காசு மூலமான மீளளிப்பு		(i) Refunds made by cash	1,183,748	
	(ii) වැරදි නිවැරදි කිරීමට අදාළ හර කිරීම්		(ii) சேகரிப்புகளின் பிழைகள் தொடர்பான வரவு		(ii) Debits relevant to Correction of errors	2,560,348	
7	ශුද්ධ ආදායම් යැකිරීම් (5-6)		நேரிய அரசிறை மதிப்பீடு (5-6)		Net Revenue Collection (5-6)		22,713,034,278
	හිඟ ආදායම් (නිශ්චිත නම්)		**அரசிறை நிலுவைகள் (ஏதாவதிருந்தால்)**		**Arrears of Revenue (if any).**	**රු./ ரூபா/Rs.**	**රු./ ரூபா/Rs.**
8	පසුගිය වසරට පෙර වසර වන විට මුළු හිඟ මුදල්		முந்திய ஆண்டிற்கு முற்பட்ட ஆண்டுவரையுள்ள நிலுவைகள்		Arrears up to the year before the previous year		
9	පසුගිය වසරට අදාළ හිඟ මුදල්		முந்திய ஆண்டின் தொடர்பில் நிலுவைகள்		Arrears in respect of the previous year		
10	වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල්		அறிக்கையிடும் ஆண்டின் தொடர்பில் நிலுவைகள்		Arreas in respect of the Reporting year		
11	වාර්තා කරනු ලබන වසර අවසානයට මුළු හිඟ මුදල - (8+9+10)		அறிக்கையிடும் ஆண்டின் முடிவில் மொத்த நிலுவைகள் (8+9+10)		Total Arrears as at the end of the Reporting year (8+9+10)		
12	වාර්තා කරනු ලබන වසර තුළ අත්හරින ලද හා කපා හරින ලද මුළු ප්‍රමාණය (එක් එක් වසර වෙන් වෙන්ව)- (i)+(ii)+(iii)		(ஒவ்வொரு ஆண்டிற்கும்) வேறு வேறாக அறிக்கையிடும் ஆண்டின் தளத்தீடு செய்யப்பட்டட பதிவழிக்கப்பட்ட தொகை (i)+(ii)+(iii)		Total amount waived and written off during the Reporting year (seperately for each year)- (i)+(ii)+(iii)		
	(i) 2021.12.31 දක්වා කපා හරින ලද මුළු ප්‍රමාණය		(i) 2021.12.31 வரை பதிவளிப்பு செய்யப்பட்ட மொத்த தொகை		(i) Total amount written off for the period up to 31.12.2021		
	(ii) 2022 වර්ෂයට අදාළව කපා හරින ලද මුළු ප්‍රමාණය		(ii) 2022 ஆண்டிற்கான பதிவளிப்பு செய்யப்பட்ட மொத்த தொகை		(ii) Total amount written off in respect of year 2022		

13	වාර්තා කරනු ලබන වසර තුළ හිඟ මුදලට අනුරූපිව යඳ්කරන ලද මුළු ප්‍රමාණය (එක් එක් වසර වෙන් වෙන්ව)- (i)+(ii)+(iii)	(ஒவ்வொரு ஆண்டிற்கும்) வேறு வேறாக அறிக்கையிடும் ஆண்டில் நிலுவைக்கு எதிராக சேகரிக்கப்பட்ட மொத்த தொகை (i)+(ii)+(iii)	Total amount collected against arrears during the Reporting year (seperately for each year)- (i)+(ii)+(iii)		
	(i) 2021.12.31 වර්ෂය දක්වා යඳ් කරන ලද මුළු ප්‍රමාණය	(i) 2021.12.31 வரை சேகரிக்கப்பட்ட மொத்த தொகை	(i) Total amount collected for the period up to 31.12. 2021		
	(ii) 2022 වර්ෂයට අදාළව යඳ් කරන ලද මුළු ප්‍රමාණය	(ii) 2022 ஆண்டிற்கான சேகரிக்கப்பட்ட மொத்த தொகை	(ii) Total amount collected in respect of year 2022		
14	වාර්තා කරනු ලබන වසර අවසාන වන විට ආදායම්වල මුළු ඉද්ධ හිඟ මුදල (12-13-14)	அறிக்கையிடும் ஆண்டின் முடிவில் இருந்தவாறான அரசிறையின் மொத்த தேறிய நிலுவைகள் (12-13-14)	Total Net Arrears of Revenue as at the end of the Reporting year (12-13-14)		
	විචලනතාව විශ්ලේෂණය (අතිරික්තය/හිඟය) වාර්තා කරනු ලබන වසර සඳහා	**மாறுபாட்டின் (மிகைக /குறைவு) பகுப்பாய்வு அறிக்கையிடும் ஆண்டு**	**Variance (Excess/ (Shortage) Analysis - Reporting year.**		**රු./ ரூபா/Rs.**
15	මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර වෙනස	மூல அரசிறை மதிப்பீட்டிற்கும் திருத்திய மதிப்பீட்டிற்கும் இடையிலான மாறுபாடு	Variance between Original Revenue Estimate and Revised Revenue Estimate		0
16	සංශෝධිත ඇස්තමේන්තුව හා ඉද්ධ ආදායම් යඳ්කිරීම් අතර වෙනස	திருத்திய மதிப்பீட்டிற்கும் உள்ளபடியான தேறிய அரசிறை சேகரிப்பிற்கும் இடையிலான வேறுபாடு	Variance between Revised Revenue Estimate and Actual Net Revenue Collection		1,286,965,722

17 ඉහත (15) හි සඳහන් විචලනතාවයට බලපෑ මැනිය හැකි හේතු / (15) இல் மாறுபாட்டிற்கான அளவிடக்கூடிய காரணங்கள்/ Measurable reasons for the variance at (15) above:

18 ඉහත (16) හි සඳහන් විචලනතාවයට බලපෑ මැනිය හැකි හේතු / (16) இல் மாறுபாட்டிற்கான அளவிடக்கூடிய காரணங்கள்/ Measurable reasons for the variance at (16) above:

දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මි.23,920ක් ලෙස දක්වා තිබුණි.මහ භාණ්ඩාගාරය විසින් එය රු.මිලියන 24,000 ක් ලෙස සංශෝධනය කරන ලදී. එම සංශෝධිත අගය සහ දෙපාර්තමේන්තු ඉද්ධ ආදායම් යඳ් කිරීම් අතර වෙනස රු.මි.1,287 කි. රාජ්‍ය නිලධාරීන්ට වයස අවු.65 දක්වා සේවය කිරීමට අවසර ලබා දුන් නමුත් පසුව රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස්වීම් මත 2022.12.31 දිනට වයස අවු.60 සම්පූර්ණ කල නිලධාරීන් අනිවාර්යයෙන් විශ්‍රම ගැන්වීම් හේතුවෙන් 2023 වර්ෂය තුලදී 40,000 අධික නිලධාරීන් සංඛ්‍යාවක් විශ්‍රම ගතු ලැබිණි. එමගින් දායක මුදල් අයකිරීම් අඩු වී ඉද්ධ ආදායම් අඩු වූ අතර වැඩි නොවීම් සහ රාජ්‍ය සේවය සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීම් සීමා කිරීම්, නිලධාරීන් සේවය අතහැරයාම් සහ විදේශගත වීම් යන හේතූන් මත ද වැන්දඹු අනන්දරු දායක මුදල් ආදායම් අඩු වී ඇත.Department has mentioned the preliminary estimates of income for the Rs.23,920 .The General Treasury has revised that for the amount of Rs. 24,000 million. The difference between preliminary estimated value and the collection of net income of the Department is Rs.1,287 million. Government Officers were allowed to serve up to the age of 65 years. But due to the change of government policy, the public officers who those reached the age of 60 years on 2022.12.31 are compulsorily retired from service. As a results of that more than 40,000 government officers were retired with effect from 2023.01.01. Due to this collection of widows' and orphans' contributions decreased and net income decreased. And also the increase in the basic salary of the civil service has not been implemented and the recruitment of new public officers has not been done as expected and due to the economic crisis, most of the civil servants have resigned and left the country. Therefore the income in widows' and orphans' contributions has marked a decrease than the estimate. ஆரம்ப வருமான மதிப்பீடு ரூ. 23,920 மில்லியன் என திணைக்களத்தால் காட்டப்பட்டுள்ளது. எனினும், பொது திறைசேரி, வருமானத்தின் ஆரம்ப மதிப்பீட்டை ரூ. 24,000 மில்லியனாகத் திருத்தியது. திருத்தப்பட்ட பெறுமதிக்கும் திணைக்களத்தின் தேறிய வருமானச் சேகரிப்புக்கும் உள்ள வித்தியாசம் ரூ.1,287 மில்லியன் ஆகும். அரசு அலுவலர்கள் 65 வயது வரை பணியாற்ற அனுமதிக்கப்பட்டனர். ஆனால் அரசின் கொள்கை மாற்றத்தால், 2022.12.31 அன்றிலிருந்து 60 வயதை எட்டியதும் அரசு அலுவலர்கள் கட்டாயமாக பணியில் இருந்து ஓய்வு பெறவேண்டும். அதன் காரணமாக, 2023.01.01 தொடக்கம் 40,000க்கும் மேற்பட்ட அரசு அலுவலர்கள் ஓய்வு பெற்றனர். அத்துடன் அரச அலுவலரின் அடிப்படை சம்பள அதிகரிப்பு நடைமுறைப்படுத்தப்படாமை மற்றும் எதிர்பார்த்தபடி அரசசேவைக்கு புதிய அலுவலர்களின் ஆட்சேர்ப்பு செய்யப்படாததுடன் பொருளாதார நெருக்கடி காரணமாக பெரும்பாலான அரச உத்தியோகத்தர்கள் பதவி விலகி நாட்டை விட்டு வெளியேறியுள்ளனர். எனவே விதவைகள் மற்றும் அனாதைகளின் பங்களிப்புகளில் வருமானம் மதிப்பீட்டைக் காட்டிலும் குறைந்துள்ளது.

මෙම මිලදීගැනීම් සඳහන් සියලම සංඛ්‍යා, වසර්ථාගත යනු උගත මිලදී ගෙවීම් සඳහන් සංඛ්‍යා සමග එකඟවන බවත්, එවා හාණ්ඩාගාර මිලදී ගැනීම් සමග සසඳන ලද බවත් සහතික කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விபரங்களுடன் ஒத்திருக்கின்றன வென்பும் இப்புள்ளி விபரங்கள் யாவும் திறைசேரி கணக்குப்புத்தகத்திலுள்ள புள்ளிவிபரங்களுடன் கணக்கிலைக்கம் செய்யப்பட்டுள்ளன வென்பும் சான்றுப்படுத்தப்பட்டுள்ளன.

Certify that all figures appear in this Account are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

ඒ. වී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.
20/කෝ/2024

දිනය / திகதி / Date: 20.02.2024

ප්‍රධාන ගණකාධිකාරි / මූල්‍ය අංශයේ ප්‍රධානි නාම සහ අත්සන
பிரதான கணக்காளரின்/நிதிப்பிரிவுத்தலைவரின் கையொப்பமும் பெயரும்
Signature and Name of Chief Accountant / Head of Finance

ආදායම් ගණන්දීමේ නිලධාරී තනතුර, නාමය සහ අත්සන
அதிகாரமளிக்கப்பட்ட கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப்பமும்,பெயரும்,பதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා / கணக்காய்வாளர் நாயகத்திணைக்களத்தின் உபயோகத்திற்கு/ For use of Auditor General's Department

ඩී.ජී.එස්.ඒ - ආදායම්-1 / அ.க.ப.ந அரசிறை-1 /DGSA-Revenue-1

2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් හිඟුම්

2023 திசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இவங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு

Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka

for the year ended 31st December 2023

ආදායම් ගණන්දීමේ නිලධාරී அரசிறை கணக்கீட்டு உத்தியோத்தர் Revenue Accounting Officer :	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ஓய்வூதியப் பணிப்பாளர் நாயகம் Director General of Pensions	වියදම් ශීර්ෂ අංකය செலவின தலைப்பு இல: Expenditure Head No.	253

ආදායම් සංකේතය அரசிறை குறியீடு Revenue code	ආදායම් සංකේත විස්තරය அரசிறை குறியீடு விவரணம் Description of Revenue Code	2023 මුලික ආදායම් ඇස්තමේන්තුව මූල அரசிறை மதிப்பீடு 2023 Original Revenue Estimate 2023	2023 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව திருத்திய அரசிறை மதிப்பீடு 2023 Revised Revenue Estimate 2023	2023 රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම (දළ ආදායම- ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேசிய அரசிறை (அரசிறை மீளளிப்புகளை கழித்து) மொத்த அரசிறை 2023 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2023	2022 රැස්කරන ලද මුළු ශු.ආදායම (දළ ආදායම්-ආදායම් ආපසු ගෙවීම්) சேகரிக்கப்பட்ட மொத்த தேசிய அரசிறை (அரசிறை மீளளிப்புகளை கழித்து) மொத்த அரசிறை 2022 Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2022
		රු./ ரூபா/Rs.	රු./ ரூபா/Rs.	රු./ ரூபா/Rs.	රු./ ரூபா/Rs.
20.04.02.00	සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා சமூக பாதுகாப்புப் பங்களிப்பு பணம மாகாண சபை Social Security Contributions provincial councils	14,000,000,000	14,000,000,000	13,545,390,542	13,543,311,342
	එකතුව/ மொத்தம்/ Total	14,000,000,000	14,000,000,000	13,545,390,542	13,543,311,342

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාරයේ ගිණුම් පොත් සමඟ සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புளி விபரங்களுடன் ஒத்திருக்கின்றன மெலும் இப்புளி விபரங்கள் நிறையேசீக் கணக்குப் புத்தக தரவுகளுடன் ஒத்துப் போகின்றது என்றும் அத்தகைச்சீர்பார்த்தப்பட்டுள்ளது.

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

ඒ. ඩී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,

දිනය / නිකதி / Date: 20.02.2024

ප්‍රධාන ගණකාධිකාරී/මුදල් අංශයේ ප්‍රධානී නම සහ අත්සන
பிரதான கணக்காளரின்/நிதிப்பகுதியின் தலைவருடைய் கையொப்பமும் பெயரும்
Signature and Name of Chief Accountant / Head of Finance

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ආදායම් ගණන්දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන
வருவாய் கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப்பமும் பெயரும் பதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

ඩී.ජී.එස්.ඒ - ආදායම්-2 / அ.க.ப.ந அரசிறை 2 /DGSA-Revenue-2

2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම

(සෑම ආදායම් සංකේතයන් සඳහාම වෙනම ගිණුමක් පිළියෙල කළ යුතුය.)

2023 திசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இவங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு

(அரசிறை குறியீடு ஒவ்வொன்றிற்குமாக தயாரிக்கப்பட்டுள்ளது)

Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2023 (To be prepared for each Revenue Code)

	ආදායම් ගණෙන්දීමේ නිලධාරි அரசிறை கணக்கீட்டு உத்தியோத்தர் Revenue Accounting Officer :		විශාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ஓய்வூதியப் பணிப்பாளர் நாயகம் Director General of Pensions		වියදම් ශීර්ෂ අංකය செலவின தலைப்பு இல: Expenditure Head No.	253
1	I ආදායම් ගිණුමට අදාළ ආදායම් සංකේතය : 20.04.02.00		I இக்கணக்கு தயாரிக்கப்பட்டுள்ள அரசிறை குறியீடு:20.04.02.00		I Revenue Code for which this Account is prepared:20.04.02.00	
	II ආදායම් සංකේත විස්තරය :සමාජ සංරක්ෂණ දායක මුදල්		II அரசிறை குறியீட்டின் விவரணம் : சமூக பாதுகாப்புப் பங்களிப்புப் பணம்		II Description of the Revenue Code: Social Security Contribution	
						රු./ ரூபா/Rs.
2	පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ඉද්ධ ආදායම් රැස්කිරීම්	වර්ෂය - 1 (2022)	මුන්නිය මූන්‍ය නිදහාසාත්තාන තේරිය අරසිරෙ සේකරිප්පු	ආණ්ඩු-1 (2022)	Net Revenue Collection for the three preceeding financial years : Year - 1 (2022)	13,543,311,342
		වර්ෂය - 2 (2021)		ආණ්ඩු-2 (2021)	Year - 2 (2021)	12,043,826,499
	(වර්ෂ 2020 සහ ඊට පෙර වර්ෂ)	වර්ෂය - 3 (2020)	(2020 ஆண்டு மற்றும் முன்னைய வருடங்களும்)	ஆண்டு-3 (2020)	(year 2020 and previous years) Year - 3 (2020)	11,022,784,468
	වාර්තා කරනු ලබන වර්ෂය සඳහා ගිණුම් විස්තර		அறிக்கையிடும் ஆண்டிற்கான கணக்கீட்டுத்தகவல்		Accounting Information for the Reporting year	රු./ ரூபா/Rs. / රු./ ரூபா/Rs.
3	මූලික ආදායම් ඇස්තමේන්තුව		මූල අරසිරෙ මතිප්පීටු		Original Revenue Estimate	14,000,000,000
4	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව		තිරුත්තිය අරසිරෙ මතිප්පීටු		Revised Revenue Estimate	14,000,000,000
5	දළ ආදායම් රැස්කිරීම්		මොත්ත අරසිරෙ මතිප්පීටු		Gross Revenue Collection	13,561,986,537
6	සිදු කරන ලද ආපසු ගෙවීම් (මුළු ප්‍රමාණය) - (i)+(ii)		செய்யப்பட்ட மீளளிப்புகள் (மொத்தம்)-(i)+(ii)		Refunds made (All) - (i)+(ii)	16,595,995
	(i) මුදලින් ආපසු ගෙවීම්		(i) காசு மூலமான மீளளிப்பு		(i) Refunds made by cash	1,287,823
	(ii) වැරදි නිවැරදි කිරීමට අදාළ හර කිරීම්		(ii) சேகரிப்புகளின் பிழைகள் தொடர்பான வரவு		(ii) Debits relevant to Correction of errors	15,308,172
7	ඉද්ධ ආදායම් රැස්කිරීම් (5-6)		தேறிய அரசிறை மதிப்பீட்டு (5-6)		Net Revenue Collection (5-6)	13,545,390,542
	හිඟ ආදායම් (නිකුති නම්)		அரசிறை நிலுவைகள் (எதாவதிருந்தால்)		Arrears of Revenue (if any).	රු./ ரூபா/Rs. / රු./ ரூபா/Rs.
8	පසුගිය වසරට පෙර වසර වන විට මුළු හිඟ මුදල්		முந்திய ஆண்டிற்கு முற்பட்ட ஆண்டுவரையுள்ள நிலுவைகள்		Arrears up to the year before the previous year	
9	පසුගිය වසරට අදාළ හිඟ මුදල්		முந்திய ஆண்டின் தொடர்பில் நிலுவைகள்		Arrears in respect of the previous year	914,684,247
10	වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල්		அறிக்கையிடும் ஆண்டின் தொடர்பில் நிலுவைகள்		Arreas in respect of the Reporting year	832,000,462
11	වාර්තා කරනු ලබන වසර අවසානයට මුළු හිඟ මුදල - (8+9+10)		அறிக்கையிடும் ஆண்டின் முடிவில் மொத்த நிலுவைகள் (8+9+10)		Total Arrears as at the end of the Reporting year (8+9+10)	1,746,684,709
12	වාර්තා කරනු ලබන වසර තුළ අත්හරින ලද හා කපා හරින ලද මුළු ප්‍රමාණය (එක් එක් වසර වෙන් වෙන්ව)- (i)+(ii)+(iii)		(ஒவ்வொரு ஆண்டாகும்) வேறு வேறாக அறிக்கையிடும் ஆண்டின் தள்ளிடு செய்யப்பட்டு பதிவுசெய்யப்பட்ட தொகை (i)+(ii)+(iii)		Total amount waived and written off during the Reporting year (seperately for each year)- (i)+(ii)+(iii)	
	(i) 2021.12.31 දක්වා කපා හරින ලද මුළු ප්‍රමාණය		(i) 2021.12.31 வரை பதிவளிப்பு செய்யப்பட்ட மொத்த தொகை		(i) Total amount written off for the period up to 31.12.2021	
	(ii) 2022 වර්ෂයට අදාළව කපා හරින ලද මුළු ප්‍රමාණය		(ii) 2022 ஆண்டிற்கான பதிவளிப்பு செய்யப்பட்ட மொத்த தொகை		(ii) Total amount written off in respect of year 2022	

13	වාර්තා කරනු ලබන වසර තුළ හිඟ මුදලට අනුරූපව රැස්කරන ලද මුළු ප්‍රතිඵලය (එක් එක් වසර වෙන් වෙන්ව)- (i)+(ii)+(iii)	(ஒவ்வொரு ஆண்டிற்கும்) வேறு வேறாக அறிக்கையிடும் ஆண்டில் நிலுவைக்கு எதிராக சேகரிக்கப்பட்ட மொத்த தொகை (i)+(ii)+(iii)	Total amount collected against arrears during the Reporting year (seperately for each year)- (i)+(ii)+(iii)		914,684,247
	(i) 2021.12.31 වර්ෂය දක්වා රැස් කරන ලද මුළු ප්‍රතිඵලය	(i) 2021.12.31 வரை சேகரிக்கப்பட்ட மொத்த தொகை	(i) Total amount collected for the period up to 31.12. 2021		
	(ii) 2022 වර්ෂයට අදාළව රැස් කරන ලද මුළු ප්‍රතිඵලය	(ii) 2022 ஆண்டிற்கான சேகரிக்கப்பட்ட மொத்த தொகை	(ii) Total amount collected in respect of year 2022	914,684,247	
14	වාර්තා කරනු ලබන වසර අවසාන වන විට ආදායමේ ලැබිය යුතු හිඟ මුදල (11-12-13)	அறிக்கையிடும் ஆண்டின் முடிவில் இருந்தவாறான அரசிறையின் மொத்த தேறிய நிலுவைகள் (11-12-13)	Total Net Arrears of Revenue as at the end of the Reporting year (11-12-13)		832,000,462
	විචලතාවේ විශ්ලේෂණය (අතිරික්තය/හිඟය) වාර්තා කරනු ලබන වසර සඳහා	**மாறுபாட்டின் (மிகைக /குறைவு) பகுப்பாய்வு அறிக்கையிடும் ஆண்டு**	**Variance (Excess/ (Shortfall) Analysis - Reporting year.**		**රු./ ரூபா/Rs.**
15	මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර විචලනය	மூல அரசிறை மதிப்பீட்டிற்கும் திருத்திய மதிப்பீட்டிற்கும் இடையிலான மாறுபாடு	Variance between Original Revenue Estimate and Revised Revenue Estimate		0
16	සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස්කිරීම් අතර විචලනය	திருத்திய மதிப்பீட்டிற்கும் உள்ளடங்கிய தேறிய அரசிறை சேகரிப்பிற்கும் இடையிலான வேறுபாடு	Variance between Revised Revenue Estimate and Actual Net Revenue Collection		454,609,458

17 ඉහත (15) හි සඳහන් විචලතාවයට බලපෑ මිනිය හැකි හේතු / (15) இல் மாறுபாட்டிற்கான அளவிடக்கூடிய காரணங்கள்/ Measurable reasons for the variance at (15) above:

18 ඉහත (16) හි සඳහන් විචලතාවයට බලපෑ මිනිය හැකි හේතු / (16) இல் மாறுபாட்டிற்கான அளவிடக்கூடிய காரணங்கள்/ Measurable reasons for the variance at (16) above:

දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මි.13,620ක් ලෙස දක්වා තිබුණි. මිහ සංඛ්‍යාලේඛනාධිපති විසින් එය රු.මිලියන 14,000 ක් ලෙස සංශෝධනය කරන ලදී. එම සංශෝධිත අගය සහ දෙපාර්තමේන්තු ශුද්ධ ආදායම් රැස් කිරීම් අතර විචලනය රු.මි.455 කි. රාජ්‍ය නිලධාරීන්ට වයස අවු.65 දක්වා සේවය කිරීමට සිවුරු ලබා දුන් නමුත් සමුව රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස්වීම් මත 2022.12.31 දිනට වයස අවු.60 සම්පූර්ණ කල නිලධාරීන් අනිවාර්යයෙන් විශ්‍රම ගැන්වීම් කරතුවෙන් 2023 වර්ෂය තුලදී 40,000 අධික නිලධාරීන් සංඛ්‍යාවක් විශ්‍රම යනු ලැබිණි. එමගින් දායක මුදල් අයකිරීම් අඩු වී ශුද්ධ ආදායම් අඩු වූ සහර වැටුප් වැඩි නොවීම් සහ රාජ්‍ය සේවය සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීම් සිමා කිරීම්, නිලධාරීන් සේවය අතහැරයාම් සහ විශේෂගත වීම් යන කරුණු මත ද වැන්දඟු කාන්තාරු දායක මුදල් ආදායම් අඩු වී ඇත..Department has mentioned the preliminary estimates of income for the Rs.13,620 .The General Treasury has revised that for the amount of Rs. 14,000 million. The difference between preliminary estimated value and the collection of net income of the Department is Rs.455 million. Government Officers were allowed to serve up to the age of 65 years. But due to the change of government policy, the public officers who those reached the age of 60 years on 2022.12.31 are compulsorily retired from service. As a results of that more than 40,000 government officers were retired with effect from 2023.01.01. Due to this collection of widows' and orphans' contributions decreased and net income decreased. And also the increase in the basic salary of the civil service has not been implemented and the recruitment of new public officers has not been done as expected and due to the economic crisis, most of the civil servants have resigned and left the country. Therefore the income in widows' and orphans' contributions has marked a decrease than the estimate. ஆரம்ப வருமான மதிப்பீடு ரூ. 13,620 மில்லியன் என திணைக்களத்தால் காட்டப்பட்டுள்ளது. எனினும், பொது திறைசேரி, வருமானத்தின் ஆரம்ப மதிப்பீட்டை ரூ. 14,000 மில்லியனாகத் திருத்தியது. திருத்தப்பட்ட பெறுமதிக்கும் திணைக்களத்தின் தேறிய வருமானச் சேகரிப்புக்கும் உள்ள வித்தியாசம் ரூ.455 மில்லியன் ஆகும். அரசு அலுவலர்கள் 65 வயது வரை பணியாற்ற அனுமதிக்கப்பட்டனர். ஆனால் அரசின் கொள்கை மாற்றத்தால், 2022.12.31 அன்றிலிருந்து 60 வயதை எட்டியதும் அரசு அலுவலர்கள் கட்டாயமாக பணியில் இருந்து ஓய்வு பெறவேண்டும். அதன் காரணமாக, 2023.01.01 தொடக்கம் 40,000க்கும் மேற்பட்ட அரசு அலுவலர்கள் ஓய்வு பெற்றனர். அத்துடன் அரச அலுவலரின் அடிப்படை சம்பள அதிகரிப்பு நடைமுறைப்படுத்தப்படாமை மற்றும் எதிர்பார்த்தபடி அரசசேவைக்கு புதிய அலுவலர்களின் ஆட்சேர்ப்பு செய்யப்படாததுடன் பொருளாதார நெருக்கடி காரணமாக பெரும்பாலான அரச உத்தியோகத்தர்கள் பதவி விலகி நாட்டை விட்டு வெளியேறியுள்ளனர். எனவே விதவைகள் மற்றும் அனாதைகளின் பங்களிப்புகளில் வருமானம் மதிப்பீட்டைக் காட்டிலும் குறைந்துள்ளது.

මෙම මිණුම්මේරි සඳහන් මියරම් සංඛ්‍යා, පවත්වාගෙන යනු ලබන මිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර මිණුම් පොත් සමඟ සසඳන ලද බවත් සහතික කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விபரங்களுடன் ஒத்திருப்பதென்பதை யாவும் இப்புள்ளி விபரங்கள் யாவும் திறைசேரி கணக்குப்புத்தகத்திலுள்ள புள்ளிவிபரங்களுடன் கணக்கிணக்கம் செய்யப்பட்டுள்ளன வென்பதும் சான்றுப்படுத்தப்பட்டுள்ளன.

Certify that the figures appear in this Account are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

ඒ. ඩී. වී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

20/02/2024

දිනය / திகதி / Date: 20.02.2024

ප්‍රධාන ගණකාධිකාරී / මූල්‍ය අංශයේ ප්‍රධානි නම සහ අත්සන
பிரதான கணக்காளரின்/நிதிப்பிரிவுத்தலைவரின் தலைவருடைய கையொப்பமும் பெயரும
Signature and Name of Chief Accountant / Head of Finance

ආදායම් ගණන්දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන
வருமான கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப්பமும்/பெயரும்/இபதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා / கணக்காய்வாளர் திணைக்களத்தின் உபயோகத்திற்கு/ For the use of Auditor General's Department

ගුරු වැන්දඹු අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදල
2023-12-31 අවසන් වර්ෂය සඳහා
ආදායම් වියදම් ගිණුම

විස්තරය	ඇමුණුම	2022 (රු.)	2023 (රු.)	විස්තරය	ඇමුණුම	2022 (රු.)	2023 (රු.)
දායක මුදල් ආපසු ගෙවීම	3	14,942,916	6,367,277	වර්ෂයට අදාළ දායක මුදල් (සටහන් අංක 4)		351,699,361	444,000,582
				පොළී ආදායම්(සටහන් අංක 3)		936,096	0
අතිරික්තය		337,692,541	437,633,305				
		352,635,457	444,000,582			352,635,457	444,000,582

ඒ.ඩී.ටී.එන්.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
2024.02.27

ඒ. ඩී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

ඒ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
2024.02.27

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
2023-12-31 දිනට ශේෂ පත්‍රය

	2022 (රු.)	2023 (රු.)		ඇමුණුම	2022 (රු.)		2023 (රු.)	
සමුච්චිත අරමුදල 01/01	2,481,847,180	2,819,539,721						
එකතු කලා			**ප්‍රවර්තන වත්කම්**					
අතිරික්තය	337,692,541	437,633,305						
			ලැබිය යුතු මුදල් (සටහන් අංක 4)		7,460,121		6,863,487	
			හා.නි.ලේ. ශේෂය	1	2,812,079,600	2,819,539,721	3,250,309,539	3,257,173,026
	2,819,539,721	3,257,173,026						
ජංගම බැරකම්								
ගෙවිය යුතු බදු (සටහන් අංක 4)	0	0						
	2,819,539,721	3,257,173,026				2,819,539,721		3,257,173,026

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වලට අනුකූලව ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ.ඉහත සඳහන් ගිණුම් ප්‍රකාශන ඊට අනුකූල බව මෙයින් සහතික කරමි.

ඒ.ඩී.ටී.එන්.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
2024.02 27

ඒ. ඩී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

ඒ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
2024.02 27

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් සැසඳුම් ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම්		
දායක මුදල් ලැබීම්	444,597,216	
දායක මුදල් ආපසු ගෙවීම්	(6,367,277)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		438,229,939
වර්ෂය තුළදී ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		438,229,939
2023.01.01 මුදල් හා මුදල් සමාන ද		
භා.නි.ලේ මුදල් ශේෂය		2,812,079,600
		3,250,309,539
2023-12-31 මුදල් හා මුදල් සමාන ද		
භා.නි.ලේ මුදල් ශේෂය		3,250,309,539
		3,250,309,539

ඒ.ඩී.ටී.එන්.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
2024.02.27

ඒ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
2024.02.27

ඒ. ඩී. ටී. එන්. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම්

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

		2023		2022	
	සටහන		රු.		රු.
බදු පෙර පොලී ආදායම	10	17,691,924,225		8,469,461,825	
බදු පසු පොලී ආදායම	ඇමුණුම -5	(569,121,284)	17,122,802,941	(176,374,653)	8,293,087,172
වියදම්					
විදුලිය		935,966		520,268	
ජලය		50,680		35,053	
වැටුප් හා වේතන		16,277,881		16,145,163	
අතිකාල		1,213,728		763,794	
දීමනා		110,250		65,500	
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා		342,082		386,795	
නිවාඩු දුම්රිය බලපත්‍ර		98,406		72,190	
ප්‍රවාහනය සහ සන්නිවේදනය		775,324		75,082	
වෙනත් පුනරාවර්තන වියදම්		124,950		760,767	
වෙනත් වියදම්		20,130		17,775	
විගණන ගාස්තු		290,000	20,239,398	275,000	19,117,387
අතිරික්තය			**17,102,563,543**		**8,273,969,785**
පොදු සංචිතයෙන් මාරු කිරීම්			-		-
දායකයන්ට විසර්ජනය කළ හැකි පොලිය	**11**		**17,102,563,543**		**8,273,969,785**
පොලී විසර්ජනය					
අනිවාර්ය දායකත්වය		3,347,412,864		2,613,719,528	
ස්වේච්ඡා දායකත්වය		5,148,657		4,024,026	
රජයේ දායකත්වය		5,018,819,464	8,371,380,985	3,914,319,481	6,532,063,035
විසර්ජනය කිරීමෙන් පසු පොලී ශේෂය					
පොදු සංචිතයට මාරු කිරීම			**8,731,182,558**		**1,741,906,750**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන		2023 රු.		2022 රු.
ජංගම නොවන වත්කම්					
ආයෝජන වියදම	1		63,647,259,791		26,547,822,990
ජංගම වත්කම්					
ආයෝජන වියදම	1	38,313,980,962		60,068,023,764	
ලැබිය යුතු පොලී	2	5,928,363,571		4,588,753,386	
ගැලපුම් ගිණුම්	3	29,802,401	44,272,146,934	29,811,315	64,686,588,465
මුළු වත්කම්			**107,919,406,725**		**91,234,411,455**
ස්කන්ධය හා වගකීම්					
සමුච්චිත අරමුදල					
අනිවාර්ය දායකත්වය	4	36,705,629,449		33,593,599,143	
ස්වේච්ඡා දායකත්වය	4	56,462,571		51,986,116	
රජයේ දායකත්වය	4	56,522,311,342	93,284,403,362	51,808,746,221	85,454,331,480
සංචිත					
ප්‍රාග්ධන සංචිත		3,790		3,790	
පොදු සංචිත	5	14,065,862,335	14,065,866,125	5,334,679,777	5,334,683,567
ජංගම වගකීම්					
නොගෙවන ලද රජයේ ප්‍රසාද මුදල්	6	35,164,944		32,489,654	
උපචිත වියදම්	7	20,215,148		19,563,647	
රජයට ලැබිය යුතු දායකත්වය	8	221,198,964		212,203,695	
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ ශේෂය	9	4,764,759		4,764,759	
පොලී ආදායම් මත ගෙවිය යුතු බදු	ඇමුණුම -5	287,793,422	569,137,237	176,374,653	445,396,408
මුළු ස්කන්ධය හා වගකීම්			**107,919,406,725**		**91,234,411,455**

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඊ/ඩිඔපී/02/ 24/20 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 29 දින

ගණන් දීමේ නිලධාරී,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනයකදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී .මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් සංකේතය - 20:04:01:00 (මධ්‍යම රජය)

(I) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද, එම විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් ආයතන විසින් බැර කරන ලද රු.මිලියන 22,080.9ක දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 3.6ක හර කිරීම්වලින් රු.මිලියන 3.5 ක හර කිරීම් තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(II) සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැති වීම තුල, ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) **ආදායම් සංකේත අංකය 20:04:02:00 සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

(I) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටිය දී මිය ගිය නිලධාරියෙකුගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙන් හා මරණ පාරිතෝෂික දීමනා යටතේ දෙවරක් අයකළ රු.178,375 ක වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම මධ්‍යම රජයේ ආදායම් ගිණුමට ගැලපිය යුතු වුවද එය පළාත් සභා ආදායම් ගිණුමට ගලපා තිබුණි.

(II) සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 14,000, ක්ද රැස්කරන ලද ශුද්ධ ආදායම රු.මිලියන 13,545.39 ක්වූ අතර රැස්කරන ලද ශුද්ධ ආදායමේ අඩු වීම ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 3.25 ක් හා වටිනාකම රු.මිලියන 454.6 ක් විය. රජයේ ප්‍රතිපත්ති හෝ වෙනත් හේතු මත අපේක්ෂා කළ පරිදි ආදායම් රැස් කිරීමට නොහැකි බව පැහැදිලි වුවද මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර නොතිබුණි.

(ඇ) ගොඩනැගිලි කුලී

(I) වර්තමානයේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම් මත පවත්වාගෙන යන ආයතන 10 කින් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.3 ක කුලී ආදායමක් හිඟව පැවති අතර මින් රු.මිලියන 1.4 ක මුදලක් මාස 12 කට වඩා පැරණි ශේෂයන් විය.

(II) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පවත්වාගෙන යන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) වෙතින් කුලී මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය සඳහා වරිපනම් බදු රු. 179,824 ක් ගෙවා තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැඩසටහන් (1) යටතේ වැය විෂයයන් 3 ක් සඳහා අයවැය ගත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.6,500,000 ඉක්මවා මුදල් රෙගුලාසි 66/69 මඟින් රු.4,580,000 ක් එනම් සියයට 70.46 ක ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු කර ඇති අතර ඒ අනුව ශුද්ධ වියදම රු.11,002,993 ක් විය.

(ආ) වැය විෂයය අංක 2507 පර්යේෂණ හා සංවර්ධන වියදම සඳහා අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.700,000 ක් වර්ෂය තුළ වියදම් කිරීමකින් තොරව

වෙනත් වැය විෂයයන්වලට මාරුකර තිබීමෙන් වියදම් නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව වියදම් ඇස්තමේන්තු කිරීම සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.10,350,870 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛ	473,617	යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් හිමි වුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප ගෙවා තිබීම නිසා හංවැල්ල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් දෙදෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

		31,953,239	(අ) රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, මියගිය හා ආබාධිත හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත හමුදා සේවා වැටුප සමඟ දත්ත පද්ධතිය අනුව අවස්ථා 116 කදී ද, ඉබ්බාගමුව වරකාපොල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 14 කදී ද එසේ ගෙවීම හේතුවෙන් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
(ආ)	2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැතිඅංක 8/2010 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	94,478,613	(ආ) ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාල සීමාව තුලදී විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව හිමි නොවුණද , එසේ ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් කලුතර, දඹුල්ල, මැදදුම්බර, හංවැල්ල, බමුණාකොටුව, මාතර, මාවනැල්ල, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දත්ත පද්ධතිය අනුව අවස්ථා 269 කදී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
		165,700	(ඇ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ කිහිපයක් හිමිවන අවස්ථාවලදී ජීවන වියදම් දීමනාව රු. 7,800 ක උපරිමයකට යටත්ව ගෙවිය යුතු වුවද මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකු වෙත විශ්‍රාම වැටුප් 3 ක් යටතේ 2011 සිට 2017 වර්ෂය දක්වා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් කර තිබුණි.
		12,328,059	(ඈ) ජීවන වියදම් දීමනාව රු.7,800 දක්වා ලබා ගත හැකි වුවද දඹුල්ල, හංවැල්ල, වරකාපොල, බමුණාකොටුව, මාතර, කෑගල්ල, ඉබ්බාගමුව, වීරඹුගෙදර, හිඟුරක්ගොඩ, යටිතුවර, බිංගිරිය, ඉබ්බාගමුව, නාරම්මල, කුරුණෑගල, අලව්ව, පොල්ගහවෙල හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 64 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි.
(ඇ)	2014 නොවැම්බර් 03 දිනැති අංක	13,743,400	විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර්

	13/2014 විශ්‍රාම වැටුප් වක්‍රලේඛය		දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් හංවැල්ල, මාතර, කෑගල්ල, අකුරණ, යටිනුවර, බිංගිරිය, මාවනැල්ල, දිවුලපිටිය, කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය මඟින් හඳුනාගත් විශ්‍රාමිකයින් 47 දෙනෙකු සඳහා අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
(ඇ)	2019 ජූනි 11 දිනැති අංක 1/2019 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	2,522,000	යම් පුද්ගලයෙකු වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ යැපීම් දීමනාව ලබාගන්නා අවස්ථාවක එම වැන්දඹු විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් වක්‍රලේඛ 01/2019 ප්‍රකාරව සංශෝධනය කළ පසු යැපීම් දීමනාව සඳහා ගෙවනු ලබන අන්තර් දීමනා ගෙවීම නතර කළ යුතු වුවද කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ නතර නොකර යැපීම් දීමනාව වෙනුවෙන් අන්තර් දීමනාව ගෙවීමෙන් එම දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
(ඉ)	2019 ජූලි 26 දිනැති අංක 1/2019 සංශෝධන II දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	10,337,836	වයස අවුරුදු 55 දක්වා ත්‍රිවිධ හමුදා මඟින් වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය අදාල නොවන බව දක්වා තිබියදී දත්ත පද්ධතියට අනුව හමුදා වැටුප ලබන යැපෙන්නන් 45 දෙනෙකුගේ හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකුගේ විශ්‍රාම වැටුපද සංශෝධනය කර ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි.
(ඊ)	2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය		
	(i) 2ඡේදය	1,995,000	දඹුල්ල, බිංගිරිය, හිඟුරක්ගොඩ, හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 18 දෙනෙකු සඳහා ඔවුන්ට හිමි රු.5000ක දීමනාව ගෙවා නොතිබීම හේතුවෙන් එම දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි.
	(ii) 2(ii) ඡේදය	21,640,000	වැන්දඹු විශ්‍රාම වැටුප ලබමින් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට, වැටුප සමඟ රු.5,000

			දීමනාව හිමි වන විට විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද දත්ත පද්ධතියට අනුව රාජ්‍ය නිලධාරීන් 223 දෙනෙකුට වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ 2022 ජනවාරි මස සිට 2023 අගෝස්තු මාසය දක්වා රු.5,000 දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
	(iii) 2(iii) ඡේදය	3,509,000	මියගිය ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ට විශ්‍රාම වැටුප සමඟ රු.5,000 විශේෂ දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද දත්ත පද්ධතියට අනුව යැපෙන්නන් 39 දෙනෙකු සඳහාද ඉඹබාගමුව, කෑගල්ල, වරකාපොල හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යැපෙන්නන් 13 දෙනෙකු සඳහාද සේවා වැටුප සමඟ විශේෂ දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
(ඇ)	2022 ජූනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	47,246,326	විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් වක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව(2022නොවැම්බර් සිට 2023පෙබරවාරි දක්වා) හඳුනානොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි.

2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ එකතුව රු.161,964,557 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.519,269 ක්ද සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.223,590 ක්ද විය. වසර 1-3 අතර අයවිය යුතු ණය ශේෂය රු.382,732 ක් විය. එම ශේෂයෙන් වැඩ තහනම් කර ඇති එක් නිලධාරියකුගෙන් රු.239,812 ක්ද සේවය අතහැර ගොස් ඇති නිලධාරියකුගෙන් රු.142,920 ක් ද අයවිය යුතු විය.

(ආ) වසර 5-10 අතර අයවිය යුතු ණය ශේෂය රු.187,600 ක් විය. එම ශේෂයෙන් වැඩ තහනම් කර ඇති නිලධාරියකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.153,509 ක්ද ද්විතීයික පදනම් මත රාජ්‍ය ආයතනවලට අනුයුක්ත වන නිලධාරීන්ගෙන් අයවිය යුතු

ණය ශේෂය රු.34,091 ක්ද විය. වසර 10-20 අතර අයවිය යුතු ණය ශේෂය රු.472,399 ක් විය. එම ශේෂයෙන් වැඩ තහනම් කර ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.195,350 ක්ද, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය සේවය රු.277,049 ක්ද විය.

2.7 තැන්පතු

වර්ෂ 02 ක් ඉක්මවූ රු.5,237,605ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) හඳුනානොගත් ලැබීම්

බැංකු ගිණුම් දෙකකට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු. 13,669,514 ක් වූ චෙක්පත් 125 ක් 2024 මැයි 16 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) අක්‍රීය බැංකු ගිණුම්

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ බැංකු ගිණුම් පසුගිය වර්ෂ ගණනාවක සිටම අක්‍රීය ගිණුම් ලෙස පවතින අතර ඒවා වසා දැමීම හෝ ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.9 තක්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) වලට අනුකූල නොවන ලෙස අත්තිකාරම් ලබාදීමේ දී ඇස්තමේන්තු සකස් කිරීමකින් හෝ වියදම් අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව එකම වැඩසටහනක් වෙනුවෙන් නිලධාරීන් හය දෙනෙකුට අත්තිකාරම් රු.100,000 බැගින් ලබාදීමට කටයුතු කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

(අ) දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික හැඳුනුම්පත් මුද්‍රණය සඳහා යන්ත්‍ර 02 ක් පිළිවෙලින් රු.473,029 කට හා රු.450,000 කට මිලදී ගැනීම හා රු.8,019,300 ක වියදමින්

හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(I) 2023 මාර්තු 08 පළමු යන්ත්‍රය ලැබී තිබු අතර යන්ත්‍රයෙහි ක්‍රියාකාරිත්වය නිවැරදිව ඇගයීමට ලක් කළ නොහැකි තත්ත්වයක් තුළ 2024 අප්‍රේල් 10 දින තවත් යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(II) යන්ත්‍රය මිලදී ගැනීමට අදාළව සකසන ලද පිරිවිතර තුල භාවිතා කළ හැකි PVC කාඩ් හෝ රිබන් වර්ගය පිළිබඳ විමසීමක් සිදුකර නොතිබුණ අතර මිල ගණන් නොකැඳවා PVC කාඩ් හා රිබන් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(III) 2023 දෙසැම්බර් 31 දිනට විමධ්‍යගත අංශය සතුව හැඳුනුම්පත් මුද්‍රිත කාඩ්පත් 17,750 ක් ඉතිරිව තිබිය දී 2023 දෙසැම්බර් 29 දින රු.500,250 ක් වැයකර කාඩ්පත් 15,000 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි මුලු කාඩ්පත් ප්‍රමාණය 32,750 ක් වූ අතර අවශ්‍යතාවය පිළිබඳ සලකා බැලීමකින් තොරව මිල දී ගැනීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය සඳහා රු.2,517,918 ක් වැයකර Core Switch එකක් සවිකිරීමේ තාක්ෂණ ඇගයීම් කමිටුවට ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (Sri Lanka cert) නියෝජිතයකු හෝ පිරිවිතර තීරණය කිරීමට හෝ පිරිවිතරවලට අනුකූලව සපයා ඇති බවට සහතිකවීමට හෝ ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති ආයතනයකින්/පුද්ගලයකුගෙන් සහය ලබා නොගෙන ඉදිරිපත් කරන ලද පිරිවිතර එකිනෙක පරීක්ෂා කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබූ අතර අදාළ ආයතනයට ගෙවීම් සිදුකිරීමෙන් පසුව ගිවිසුම අත්සන් කර තිබුණි.

3.2 පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රුපියල් මිලියන 936.1 ක් විය. මෙම වටිනාකම, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රුපියල් මිලියන 1.5 කින්ද, වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රුපියල් මිලියන 48.9 කින්ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රුපියල් මිලියන 885.7 කින්ද සමන්විත විය.

(ආ) හානි හා පාඩු පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් එවන ලද වාර්තාවල සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය සමඟ දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂයන් නොසැසඳුනි.

(ඇ) යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 06 දෙනෙකු වෙත වැටුප් සංශෝධන හා වක්‍රලේඛ වලට අනුකූල නොවන පරිදි අන්තර් දීමනාව ලෙස රු.872,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකු සඳහා අදාළ දුබලතා විශ්‍රාම වැටුප 2018 ජූලි 17 දිනැති 9/2008 (සංශෝධන) අනුව ගැලපුම් කර තිබුණ ද එම විශ්‍රාමිකයින්ට වැඩිපුර ගෙවා තිබූ රු.536,008 ක මුදල 2023 නොවැම්බර් දක්වා ආපසු අයකර ගෙන නොතිබූ අතර තවත් විශ්‍රාමිකයෙකුට දුබලතා විශ්‍රාම වැටුපට හිමිකම් ඇත්තේ 2022 මාර්තු 22 වැනි දිනය දක්වා පමණක් වුවද එදින සිට 2023 නොවැම්බර් මාසය දක්වාම දුබලතා විශ්‍රාම වැටුප ගෙවීමෙන් රු.88,099 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) හමුදා ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් පරීක්ෂාවේදී හමුදා සේවා වැටුප් සමඟ ජීවන වියදම් දීමනා ගෙවීම් හේතුවෙන් විශ්‍රාම වැටුප් සමඟ ගෙවන ජීවන වියදම් දීමනාව චක්‍රලේඛවලට අනුගත වෙමින් නිවැරදිව නතර කර තිබුණද විශ්‍රාමිකයින් 23 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවා තිබූ රු.1,715,550 ක මුදල 2023 නොවැම්බර් වනවිටත් අයකර නොතිබූ බව දත්ත පද්ධතිය පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ඊ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයෙකුට යැපීම් දීමනාව 2013 මාර්තු මාසයේ සිට 2023 සැප්තැම්බර් මස දක්වා රු. 342,900 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(උ) 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයකු මාසිකව ලබන ජීවන වියදම් දීමනාව රු.7,800 ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව ලබාගත නොහැකි බව පදනම් කොටගෙන එකම කරුණක් මුල් කරගෙන පැන නගින්නා වූ විශ්‍රාම වැටුපකට හා දීමනාව යන දෙකටම ජීවන වියදම් දීමනාව ගෙවීම මත භේදයට තුඩුදෙන කරුණක් බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව විශ්‍රාම වැටුප හා යැපීම් දීමනා අවස්ථා දෙකේදීම ගෙවා තිබීමෙන් බමුණාකොටුව, වීරඹුගෙදර, හංවැල්ල, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 16 දෙනෙකු සඳහා රු.5,938,755 ක් වැඩිපුර ගෙවා තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(ඌ) විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් මියගිය විදේශ විශ්‍රාමිකයන් (2023 හා ඊට පෙර වර්ෂවල) ලෙස හඳුනාගත් විශ්‍රාමිකයන් සඳහා වැඩිපුර ගෙවා ඇති බැංකුවෙන් ආපසු ගෙන්වා ගතයුතු ශේෂයන්ගෙන් 2023 වර්ෂයේ දී බැංකුවට ඉදිරිපත් කරන ලද වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් අයකර ගැනීම් පිළිබඳ ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනවන විට රු.29,539,809 ක මුදලක් තවදුරටත් අයකරගත යුතු බව නිරීක්ෂණය විය. මෙම ශේෂය තුළ 2023 වර්ෂයට පෙර වර්ෂවල දී මියගිය විශ්‍රාමිකයන් සඳහා වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු. 15,506,715 බවද නිරීක්ෂණය විය.

(එ) මහරගම, කැස්බෑව හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයයන් 05 දෙනෙකු මිය ගිය දිනය හඳුනාගෙන තිබුණද වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් රු.1,936,086 ක් 2023 නොවැම්බර් දක්වා අය කර නොතිබුණි.

(ඒ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකුට වැඩිපුර ගෙවන ලද දුබලතා වැටුප් එකතුව රු.323,763 ක් අයකර ගෙන නොතිබුණි.

3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 42 කින් විගණන විමසුම් 10 කට 2024 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 කලමනාකරණ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකු 2019 ජූලි 04 මියගොස් ඇති බව 2019 ජූලි 06 දැනැති ලිපියෙන් ග්‍රාම නිලධාරි විසින් බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා තිබුණ ද ඔහුගේ විශ්‍රාම වැටුප් (යැපීම් දීමනාව) භාර්යාව වෙත ලබාදිය යුතු වුවද 2023 නොවැම්බර් වන විටත් රු.269,239 ක් ගෙවීම් කර නොතිබුණි.

(ආ) බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 4–70181 දරන ඩබ්.එම්.කරුණාදාස යන අයට 2020 අගෝස්තු 20 දිනැති ග්‍රාම නිලධාරිගේ ලිපියෙන් 2020 අගෝස්තු 13 දින මියගිය බව දන්වා ඇතත් විශ්‍රාම වැටුප් අංක 4-70182 දරන එස්.ඒ.එස්.නෝනා මහත්මියට ඉතිරි යැපීම් දීමනාව රු.239,557ක් 2023 නොවැම්බර් දක්වාත් සකස් කර ගෙවා නොතිබුණි.

(ඇ) යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකුට අදාලව වැන්දඹුවගේ දික්කසාද සහතිකය පරීක්ෂා කිරීමකින් තොරව විවාහ සහතිකය මත පදනම්ව විශ්‍රාම වැටුප සක්‍රීය කර තිබීම හේතුවෙන් වැඩිපුර ගෙවන ලද මුදල රු.355,743 ක් බව නිරීක්ෂණය විය.

(ඈ) අංක 15-14578 දරන විශ්‍රාම වැටුප 2022 අප්‍රේල් මස සිට ස්ථිරව නතර කර තිබූ අතර 2008 ජනවාරි 01 සිට 2022 මාර්තු 10 දින දක්වා වැඩිපුර ගෙවූ රු.1,419,750 ක මුදලින් රු. 1,405,750 ක් අය කර ගැනීම සඳහා 2023 නොවැම්බර් දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබන වැන්දඹුවක් සඳහා සිය කලත්‍රයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු යුධ හමුදා මූලස්ථානයෙන් ගෙවන ලද සේවා වැටුප 2023 ජූලි 27 සිට නතර කිරීමෙන් පසු 2023 ජූලි 28 සිට ආරම්භ කළ යුතු සංශෝධිත විශ්‍රාම වැටුප සමඟ ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව හා රු.5,000 ක දීමනාව දළ වශයෙන් එකතුව රු.267,988ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලබන අනත් දරුවෙකුගේ අවුරුදු 26 සම්පූර්ණ වීමෙන් පසු 2020 ජූලි 10 දිනට වැටුප් නතර කර 1998 වර්ෂයේ උපන් අනෙක් අනත් දරුවාට 2020 අගෝස්තු සිට 2021 නොවැම්බර් දක්වා වැටුපෙන් භාගයක් හිඟයක් සමඟ 2021 දෙසැම්බර් සිට හිමි ගන්වා ඇතත් ඔහු වෙත ලැබිය යුතු සම්පූර්ණ වැටුප සමඟ සම්පූර්ණ ජීවන වියදම් දීමනා හා අන්තර් දීමනා හිමිගන්වා නොමැතිවීම හේතුවෙන් රු.500,491 ක් අනත්දරු වැටුප අඩුවෙන් ගෙවා තිබුණි.

(ඇ) විදේශ විශ්‍රාමිකයන් 2020,2021 හා 2022 වර්ෂයන් වලදී ජීවිත දත්ත සහතික ලබානොදීම මත විශ්‍රාමිකයන් 2370 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාම වැටුප තාවකාලිකව නවතා තිබුණද 2024 පෙබරවාරි වන විටත් ඒ පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලිපි හා ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීම ප්‍රමාදවීම පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) බාල වයස්කාර දරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් අනතුරුව අදාල බැංකු පාස් පොත බාල වයස්කරුවන් වෙත භිමි ගැන්වීමට කටයුතු කලයුතු වුවත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකතු වටිනාකම රු. 613,636 ක් වන බැංකු පාස්පොත් 04 ක් හා සථාවර තැන්පතු සහතික 01 ක් එම බාල වයස්කරුවන් අදාල ලිපිනයන්හි පදිංචි වී නොමැති බැවින් භිමි ගැන්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 27 දින වයස අවු. 60 සම්පූර්ණ වී විශ්‍රාම ගිය වෛද්‍යවරයකු වෙත පොළොන්නරුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය මඟින් තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම මත 2024 ජනවාරි මාසය වන විටත් වර්ෂ 11 ක් ගත වී තිබුණ ද විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඊ/ඩිඔපි/02/24/19 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 මැයි 10 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ආඥා පනතේ 5 හා 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6(1) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් ,නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණය
1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත	
(i)නියෝග අංක 04	ගුරු වැන්දඹු දායක මුදල් වලින් අරමුදලක් ගොඩනඟා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතු වුවද, දායක මුදල් රැස් කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා නොගෙන දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි.
(ii)නියෝග අංක 9(අ)	එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ

(අ) සාමාජිකයන්ගේ නම, පාසල, ඇතුළත් ලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල හා හිඟ මුදල්, අරමුදලේ සාමාජික සංඛ්‍යාව,සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නිවැරදිව හඳුනාගැනීමට නොහැකි විය.

(ආ) මෙම අරමුදලේ අරමුණු ඒකාබද්ධ අරමුදලේ 253 දරන විසර්ජන ශීර්ෂයෙන් ඉටුවන බැවින්, මෙම අරමුදල අත්‍යවශ්‍ය නොවුවද අරමුදලට අදාල පනත් සංශෝධනය කළයුතු බවට යෝජනා වී තිබුණද එම යෝජනාව මෙතෙක් ඉටුවී නොතිබුණි.

(ඇ) දායක මුදල් හා වෙනත් ආදායම් රැස්කිරීම් සහ දායක මුදල් ආපසු ගෙවීම් සඳහා අවසන් ගිණුමෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම පවත්වාගෙන ගොස් තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ නිරූපණය කර තිබූ රු.3,250,309,539 ක භාණ්ඩාගාර ලේකම්ගේ ශේෂය නාමික ශේෂයක් බව ගිණුම් සටහන් මඟින්ද දක්වා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/E/LGPF/24/01 මෙහි අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 මැයි 31 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද , පූර්ව වර්ෂවලට හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල රු. 77,965,865 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් 2023 වර්ෂයේ විශ්‍රාමිකයින් සඳහා රු.932,929,839 ක දායක මුදල් ගෙවා තිබුණි. පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.77,965,865 ක් වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මුදල් දායක මුදල් ලැබීමේදී සෘජුවම ගිණුම් ගත කර නිබුණද ඒ සම්බන්ධීකරණ ගිණුම්වල හෙළිදරව් කිරීම් කර නොනිබුණු අතර එම මුදලින් රු. 16,701,878 ක් පෙර වර්ෂ සඳහා ලැබීම් වුවත් එම වටිනාකම් . ඌනතාවය සමුච්චිත අරමුදලට බැර කිරීම් ලෙස ආදායම් වියදම් ගිණුමට ගලපා නිබුණි.

(ඇ) පුදුක්කුඩියිරුප්පු ප්‍රාදේශිය සභාවේ 2018 පෙබරවාරි 12 අංක 419091 දරන චෙක්පත මඟින් එවන ලද රු. 858,060ක්වූ දායක මුදල් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම වෙනුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම හේතුවෙන් එම වටිනාකමින් ලැබිය යුතු දායක මුදල් ශේෂය වැඩියෙන් දක්වා නිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 303 කින් ලැබිය යුතු රු.1,073,077,382 ක් වූ දායක මුදලින් පළාත් පාලන ආයතන 59 කට අදාලව ලැබිය යුතු රු.74,922,370 ක දායක මුදල් සඳහා ශේෂ නහවුරු කිරීම් ලැබී නොනිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 152 කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් හා පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් අතර රු.712,143,081 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 58 කින් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දායක මුදල් රු. 255,165,041 ක් වුවත්, අදාල පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදලක් නොමැති බව නිරීක්ෂණය විය.

ඉහත විස්තර කර ඇති පරිදි, ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් නහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් තත්ත්ව විස්තරය, ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම. පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ (ඉ) සිට (උ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රාජ්‍ය මුදල් වනුලේඛ අංක 07/2016 අනුව 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මඟින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් 2016 ජූනි 11 දින විශේෂ කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම අරමුදලට අදාල පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබුණද ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම වාර්තාවේ හිඟ දායක මුදල් අදාල ආයතන වෙතින් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබූ නිර්දේශයද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ශිෂ්‍යුම්

මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 303 කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,073,077,382 ක් වූ අතර ඉන් 2023 වර්ෂයේ දායක මුදල් ලැබී නොනිබුණු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 81 ක් වූ අතර අදාල ආයතන වලින් ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.284,259,658 ක් විය.

3.3. කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ලැබීම් ගෙවීම් සාරාංශයෙහි ඇතුළත් සම්මාලෝචිත වර්ෂයේ මුළු දායක මුදල් ලැබීම්. පෙර වර්ෂ සඳහා ලැබීම් හා සම්මාලෝචිත වර්ෂය සඳහා ලැබීම් වශයෙන් වර්ග කර හඳුනා ගෙන නොනිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල යටතේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් 04 දෙනෙකු 2016 ඔක්තෝබර් හා 2022 අප්‍රේල් කාලය තුළ මියගොස් තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන්ගේ නම් පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්ගේ නාම ලේඛනයෙන් ඉවත් නොකර. පළාත් පලාන ආයතන වෙතින් දායක මුදල් ඇයකර නිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/E/PSPF/24/01 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජූනි 20 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රු.221,198,964 ක්වූ ලැබිය යුතු රජයේ දායක මුදල සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් කවර ආයතනයන්ගෙන් කුමන දායකයින් සඳහා ලැබිය යුතු දායක මුදල්ද යන්න තහවුරු නොවුණි.

(ආ) එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල ශේෂ උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.36,705,629,449 හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු.56,522,311,342 ක නිවැරදිතාවය තහවුරු නොවුණි.

(ඇ) ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු.56,462,571 ක් වූ ශේෂය සම්බන්ධයෙන් හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) 1989 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන ගැලපුම් ගිණුමේ ශේෂය තුළ ඇතුළත් රු.5,644,476 ක ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලැබිය යුතු පොළී ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය , සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ (අ) සිට (ඒ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ නමින් බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

රු.17,102,563,543 ක්වූ පොලි ආදායම දායකයින් අතර විසර්ජනය කිරීම සඳහා ආරම්භක මාසික වෙන් කිරීම් වටිනාකමෙන් සාමාන්‍ය අගයක් පදනම් කොටගෙන අනුපාතය තීරණය කර තිබුණ ද එම පදනම විගණනයට අනාවරණය නොවූ අතර එමනිසා පොලි ආදායම් දායකයින් අතර සම්පූර්ණයෙන් බෙදියාමක් සිදුනොවන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී රු.8,731,182 ක්වූ පොලි ආදායමක් දායකයින් අතර නොබෙදා පොදු සංචිතයට මාරුකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. චිත්‍රරත්න
විගණකාධිපති

04. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
නව විශ්‍රාම වැටුප් ප්‍රදානය	විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත	2023 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන	42,000	-	89.58%	-	-
	විශ්‍රාම වැටුප් ප්‍රදානය- මධ්‍යගත		2,100	92.52%	-	-	-
	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය		9,000	115.32%	-	-	-
සංශෝධන ගෙවීම්	විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත	ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය	3,120	-	-	-	28.46%
	විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත		600	-	-	-	45.33%
පාරිතෝෂික හා වෙනත් ගෙවීම්	මරණ පාරිතෝෂික	මරණ පාරිතෝෂික ගෙවන ලද අයඳුම්පත් සංඛ්‍යාව	1,250	104.08%	-	-	-
	ආබාධිත විශ්‍රාම වැටුප්	ගෙවූ ආබාධිත විශ්‍රාම වැටුප් සංඛ්‍යාව	10,000	-	88.22%	-	-
	සත්කාර පියස	සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව	40,000	95.76%	-	-	-
මාසික විශ්‍රාම වැටුප්	මාසික විශ්‍රාම වැටුප් සිවිල්	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	497,778*12	100%	-	-	-
	පාරිතෝෂික ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන		100%	-	-	-

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
සමාජ සුභසාධන	ත්‍රිවිධ හමුදා සහ පොලිස්	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	41,363*12	100%	-	-	-
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	185,408*12	97.7%	-	-	-
දුම්රිය බලපත්‍ර	විශ්‍රාමිකයින් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	497,778*12	-	76.5%	-	-
විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල් විශ්‍රාම වැටුප් විදේශීය සිවිල් විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම	විශ්‍රාමිකයින් හා වැන්දඹුවන් සංඛ්‍යාව	300	128%	-	-	-
	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, විදේශීය වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම		150	104%	-	-	-
	හමුදා විශ්‍රාම වැටුප් විදේශ හමුදා විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම		150	114%	-	-	-
	විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ නව වැන්දඹු විශ්‍රාම වැටුප් විවෘත කිරීම		100	-	78%	-	-
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින් සඳහා)	විශේෂ කමිටු අනුමැතිය මත රු.500,000/- ට වැඩි වටිනාකමක් සහිත හිඟ මුදල් ගෙවීම		200	-	-	61%	-

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින් සඳහා)	2021 වාර්ෂික ජීවිත සහතික ලබා නොදීම හේතුවෙන් විශ්‍රාම වැටුප් නතර කිරීම		400	-	-	62%	-
	2022 වාර්ෂික ජීවිත සහතික ලබා නොදීම හේතුවෙන් විශ්‍රාම වැටුප් නතර කිරීම		250	268%	-	-	-
විදේශ විශ්‍රාමිකයින් ගේ වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීන කිරීම	2023 වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීන කිරීම		9,000	-	79.23%	-	-
	වාර්ෂික ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නතර කරන ලද විශ්‍රාම වැටුප් නැවත ආරම්භ කිරීම		3,000	-	-	52%	-
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල්	විශ්‍රාමිකයින් ගණන	8,000	130.7%	-	-	-
	හමුදා						
	විෂමතා						
වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආදායම	මධ්‍යම රජය	මාසික අදායම	23,920**	-	86.75%	-	-
	පළාත් සභා	මාසික අදායම	13,620**	99.56%	-	-	-
	ගුරු වැන්දඹු අනත්දරු	මාසික අදායම	280**	143%	-	-	-
වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම	සිවිල්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	1200	138%	-	-	-
	හමුදා	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	1200	119%	-	-	-
	ගුරු වැන්දඹු අනත්දරු	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	35	-	-	57%	-
	පොදු 29	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	30	93%	-	-	-
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව	වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව	19,200	-	-	52.9%	-
	දායක මුදල් ගෙවීම්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	6,000	-	85%	-	-
	දායක මුදල් ලැබීම්	මාසික දායකත්වය 8% හා 12%	900**	-	88%	-	-

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	ආයෝජන	වර්ෂය තුල සිදු කරන ලද නව ආයෝජන	7800**	195.9%	-	-	-
මානව සම්පත් සංවර්ධනය	ධාරිතා සංවර්ධනය	පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම	22	100%	-	-	-
දෘඩාංග පහසුකම් සංවර්ධන කටයුතු	දෘඩාංග මිලදී ගැනීම	පරිගණක	80	100%	-	-	-
		ස්කෑන් යන්ත්‍ර	75	100%	-	-	-
		මුද්‍රණ යන්ත්‍ර	50	100%	-	-	-
		Core Switch	1	100%	-	-	-
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල්	විශ්‍රාමිකයින් ගණන	8,000	130.7%	-	-	-
	හමුදා						
	විෂමතා						
සේවා ගිවිසුම් යාවත්කාලීන කිරීම	ලිපිගොනු කළමනාකරණ පද්ධතිය	සේවා ගිවිසුම	01	100%	-	-	-
	ජීවිත සහතික යාවත්කාලීන කිරීමේ පද්ධතිය	සේවා ගිවිසුම	01	-	-	-	40%
	LGN Service	සේවා ගිවිසුම	01	-	-	72%	-
පද්ධති ආරක්ෂාව	CERT	සේවා ගිවිසුම	01	100%	-	-	-
ආයතනික පරිසරය වැඩි දියුණු කිරීම	දෙපාර්තමේන්තු පරිශ්‍ර සංවර්ධනය	2023 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම		100%	-	-	-
	රම්බොඩ හා කැළණිය නිවාඩු නිකේතනය නවීකරණය කිරීම			100%	-	-	-

** - ආදායම් ලැබීම්

05.තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1.හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
01.කොතනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම.	1.3. 2030 වන විට සාධාරණ හා තිරසාර හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	1.3.1.f.i. රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)			

2023 වර්ෂයේ විශ්‍රාමිකයින් 704,795 ක් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කර ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය අනුව එම පුද්ගලයින්ගේ අනුපාතය පහත පරිදි දක්වා ඇත.
ස්ත්‍රී - 49.1%
පුරුෂ - 50.9%

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කරමින් “සැමට විශ්‍රාම” ප්‍රතිපත්තිමය යෝජනාවලිය ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර එය රාජ්‍ය ප්‍රතිපත්ති මත ද තීරණය වන්නකි.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු ආඥා පනත ආදී නෛතික රාමු හා රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුව විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ප්‍රතිපත්ති හා බද්ධ වේ.

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වගකීම් යොමුවන බව සඳහන් උප දර්ශකය (1.3.1.f.i.) වන රජයේ විශ්‍රාම වැටුපක් ලැබෙන වයස්ගත ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව හුදෙක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් කළමනාකරණය කළ නොහැකිය. අර්ධ රාජ්‍ය ආයතන සේවක අර්ථසාධක අරමුදල වැනි පසු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේද පවතින අතර, තාවකාලික රැකියා සහ ස්වයං රැකියා සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ඇති කිරීමට නම් එයට අදාල වන සියළු අංශ සහ ආයතන එක්ව කටයුතු කළ යුතු වන අතර මේ සඳහා සියළු ආයතන සමඟ සම්බන්ධතා පවත්වනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව, සමාජ සේවා අමාත්‍යාංශය හා කෘෂි රක්ෂණ මණ්ඩලය වැනි ආයතනයන්හි දායකත්වය ලබා ගත යුතුවේ. එබැවින් එවැනි ආයතන මැදිහත්වීමකින් තොරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් අදාල ඉලක්ක, දත්ත හා ප්‍රගතිය මැනීමේ දර්ශක යනාදිය හඳුනා ගැනීම ප්‍රායෝගික නොවේ.

06. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	35	28	07
තෘතියික	11	08	03
ද්විතියික	1102	1056	46
ප්‍රාථමික	97	80	17
එකතුව	**1245**	**1172**	**73**

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	පුහුණු වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය)
			දේශීය	විදේශීය	
විමධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	915	දින 1/2	මාර්ගගත		දේශීය
මධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	604	දින 1/2	මාර්ගගත		
විමධ්‍යගත හා මධ්‍යගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීමේ සැසිය	650	දින 1/2	මාර්ගගත		
විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (දමිළ භාෂා මාධ්‍ය)	215	දින 01	මාර්ගගත		
විශ්‍රාම වැටුප් අයදුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කලාප කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වන පුහුණු වැඩසටහන	300	දින 01	මාර්ගගත		

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව වැන්දඹු හා අනත්දරු දායක මුදල් පද්ධතියේ ලියාපදිංචිය සම්බන්ධව රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සූදානම් කළ විශේෂ මාර්ගගත (Online) වැඩසටහන	341	දින 01	මාර්ගගත		දේශීය
ජීවිත සහතික ලබා ගැනීම සහ වැඩිපුර ගෙවීම් සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම	185	දින 01	මාර්ගගත		
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම. භාරකරුවන් සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම.	118	දින 1/2	මාර්ගගත		
PD3 අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීම	548	දින 1/2	මාර්ගගත		
විශ්‍රාම වැටුප් තොරතුරු තාක්ෂණ පද්ධති සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා පැවති මාර්ගගත සැසිය	120	දින 1/2	මාර්ගගත		
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පැවති ආයතනික කටයුතු සහ ගොනු කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන	65	දින 1/2	රු. 14270.00 වි.වැ.දෙ.		
විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමේ මාර්ගගත සැසිය	355	දින 1/2	මාර්ගගත		
හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමේ මාර්ගගත සැසිය	324	දින 1/2	මාර්ගගත		
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රියදුරු මහතුන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.	10	දින 1/2	රු.1200.00 වි.වැ.දෙ.		
ලිපිගොනු කළමනාකරණ පද්ධතියේ (Auradoc) නව සංස්කරණය හඳුන්වාදීම සම්බන්ධව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.	-	දින 1/2	මාර්ගගත		

විශ්‍රාම වැටුප් මාසික ගෙවීම් සම්බන්ධ මාර්ගගත පුහුණු වැඩසටහන	178	දින 1/2	මාර්ගගත		දේශීය
විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් හා එම පද්ධතිය සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමේ මාර්ගගත සැසිය	274	දින 1/2	මාර්ගගත		
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා Excel පුහුණු වැඩසටහනක් පැවැත්වීම	73	දින 04	වි.වැ.දෙ.		
කනිෂ්ඨ සේවක නිලධාරීන් සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන	33	දින 01	වි.වැ.දෙ.		
අධ්‍යයන පාඨමාලා සඳහා					
ටී. ජනගන් මියගේ (නියෝජ්‍ය අධ්‍යක්ෂ මධ්‍යගත) Master of Business Administration Degree Programme 2022-2023 (උපාධි පාඨමාලාවේ පස්වන වාරිකය ගෙවීම)	01	වසර 2	150,000.00		දේශීය
ඩබ්.සී.විල්.අල්විස් මෙය (සහකාර අධ්‍යක්ෂ - වැ.අ.වි.වැ) ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව 2022-2023	01	වසර 2	165,880.00		
ඊ.වී.නාලිකා වීදිරිසිංහ මිය Higher National Diploma in Public Procurement පාඨමාලාව	01	වසර 1 මාස 2	138,000.00		

07. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			
1.6	වෙනත්	-		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කළ යුතු බැවින් කාල ප්‍රමාදක් ඇතිවේ.	

6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	වාර්තා වලින් පෙන්වාදී ඇති කරුණු සම්බන්ධයෙන් සොයා බලා නිවැරදි කර පිළිතුරු ඉදිරිපත් කිරීමේදී කාල ප්‍රමාදයක් සිදු වන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් විමසීමේදී දන්වන ලදී.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ගනුදෙනු ප්‍රමාණය අධිකවීම මත සියළු නිවැරදි කිරීම් මසක් තුළ නිවැරදි කිරීමට නොහැකි වී ඇත.	
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම	අනුකූල වේ		
12.	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පියවීමට ඇත.	
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	ආයතනයේ කාර්යභාරයට අනුකූලව සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.	හැකිතාක් රා.ප.ච.02/2018 චක්‍රලේඛයට අනුකූලව මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට උත්සාහ කිරීම.

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම" නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20.	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		



ශ්‍රී ලංකා විශ්‍රාම

இலங்கை ஓய்வு

Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10

ஓய்வூதியத் திணைக்களம், மாளிகாவத்தை, கொழும்பு -10.

Department of pensions, Maligawaththa, Colombo 10

www.pensions.gov.lk